# රෝහණයේ

# කොඩි අත්පිටපත

මහජන පුස්තකාලය

සාහිත්‍යසූරි
ආචාර්ය ඩබ්.ඒ.පී.අභයවර්ධන
අභය නිකේතනය,
69.පී.එච්.පෙරේරා මාවත,
බොරලැස්ගමුව.

# හැඳින්වීම

"පුද්ගලයකුගේ හෝ භාණ්ඩාරක හෝ යුද හමුදාවක හෝ වර්ගයක් හෝ සලකුණක් දැක්වෙන රෙදි කැබැල්ල කොඩිය යනුවෙන් සලකනු ලැබේ."[1] මෙම කොඩිවලින් බොහොමයක් වර්ණවත් වූ බවද කිව හැකිය. එහෙත් මුල් අවස්ථාවේදී භාවිත කරන ලද කොඩි වර්තමානයේ පරිසමාප්ත අර්ථයෙන් අද භාවිත වන කොඩි ලෙස සැලකිය නොහැකිය.

මුලදී කොඩි භාවිත කළේ යුද්ධ අවස්ථාවලදීය. පෙර මිසර වැසියන් විසින් කොඩි වැනි සංකේත යුද්ධය පිණිස යොදා ගන්නා ලද බවට සාක්ෂි ඇත්තේය.[2] ඒවා බොහෝ විට සලකුණු පමණක් වී. පැරණි මිසර රජවරුන් ඉද්දරයෝ ගොනාගයේ සහ වසඟදුන්ය. එක් සංකේතයක් ලෙස රජකුගේ පෙකණිවැල දැක්වූ බවට එක් ග්‍රන්ථයක සඳහන් වේ.[3] චීනයේද අයසට පත්වූ සතුරාගේ හිස සලකුණක් හැටියට භාවිත කළ අතර, එය යෂ්ටියක සවිකොට තැබීමේ සිරිත අදත් ඇසෑම් ප්‍රදේශයේ පවතී. ලංකාවේද මෙවැනි සිරිතක් පැවති බව රැල්ෆ් පීරිස් මහතා සිංහල සමාජ සංවිධානය යන පොතේ 101 වන පිටුවේ සඳහන් කරයි. "සංග්‍රාමයේදී ජීවිතක්ෂයට පත්කරන ලද සතුරන්ගේ හිස් මග දෙපස එල්ලා තැබීම යුද්ධ කාලයේදී සුලබ දර්ශනයක් විය."

කොඩිවල ප්‍රභවය ඉන්දියාවේ හෝ චීනයේ හෝ ඇතිවූ බව පොදු විශ්වාසය වුවත් පැරණි දඹදිව සංස්කෘතියටත් වඩා පැරණියයි සිතිය හැකි මිසර හා බැබිලෝනියානු සංස්කෘතීන් විසින්ද, දඬු පතාක ආදිය භාවිත කළ බව මිසර කැටයම් වලින් හා පැරණි බැබිලෝනියානු මුද්‍රාවලින්ද පිළිබිඹු වේ.

---

1. Encyclopedia Britannica - Section on Flags 1962 Edition.
2. World Book Encyclopedia - Section on Flags 1963 "
3. Encyclopedia Britannica - Section on Flags 1962 "

ක්‍රි: පූ: 1122 දී චීනයේ "චව්" පරපුර අත්කළ තැනැත්තා සුදු කොඩියක් පෙරටු කොට ගමන් ගත් බවත්, ක්‍රි: පූ: 660 දී, ජපන් කුමරයකු රජ ඉදිරියට තම කොඩිය පහත් නොකිරීම නිසා, දඬුවම් ලද බවත් පෙනේ. චීන කොඩිවල රතු-කුරුල්ලා, සුදු කොටියා, නිල් දැගන් (මකරා) වැනි සලකුණු ඇත. මේවා රටවල බෙදී අතර යටත් කරගත් නගර හා රාජ්‍ය මතද ඔසවා තබා ලදී. කොඩි කොතරම් උසස් කොට සැලකීය යත්, එය දරන තැනැත්තා ඇල්ලීම පවා අපරාධයක් ලෙස සලකා ඇත. පහර දීමේ මුල්ම වස්තුව කොඩියයි. මෙය වැටීම පරාජයේ හෝ අසාර්ථකත්වයේ සලකුණයි.

ඇතැම් විට හා රටවල බැඳුණු ගිය කොඩි ඉන්දියාවේද වැදගත් තැනක් ගත් බව සාහිත්‍ය ග්‍රන්ථවලින් පෙනේ. නව ක්‍රමයට සකස් වූ ඉන්දියානු කොඩි ත්‍රිකෝණාකාරය. මේවා රන් නූලෙන් මැසූ රූපයක් සහිත ලෝහිත හෝ හරිත වර්ණයෙන් යුක්ත විය.

ඉන්දියාවෙන් පුරුදු වූ කොඩි භාවිතය ඉස්ලාම් ඉතිහාසයේ ආරම්භයේ සඳහන් වේ. මේවා බොහෝ විට කළු, සුදු හෝ රතු රෙදි කෑබලිය. "ක්‍රි: ව: 746 දී අබ්බාසයිඩ් රජ වරුන් කළු කොඩියක් තෝරාගැනීමත්, ඔමායාඩ් හා අලීගේ පරපුර සුදු කොඩි තෝරා ගැනීමත්, කාවරිජ් (KAAWARIJ) රතු කොඩිය තෝරා ගැනීමත්, සඳහන්ය. හරිතය ෆැටිමයිට් (FATIMITE) රජ පරපුරේ වර්ණයයි.[4] මෙය මුස්ලිම් භක්තිකයන් අද දක්වා භාවිත කරන වර්ණය බවට පත් වී ඇත.

කොඩිවල යොදා තිබූ විවිධ වර්ණ විවිධ අදහස් ප්‍රකාශ කිරීමට යෙදූ බව පෙනේ. විවිධ වර්ණ විවිධ අදහස් හා පරමාර්ථ සඳහා යෙදූ බවට සාක්ෂි ඇති හෙයින් එක වර්ණයකට සීමාවූ එක් අදහසක් ම නොමැති වූ බව ස්ථිරය පැහැදිලිය. පොදු වශයෙන් පහත දැක්වෙන වර්ණවලින් ඒ හා දැක්වෙන අදහස් ප්‍රකාශිත බව එක් රිපෝර්තුවක මෙසේ දක්වා ඇත.[5]

---

4. Encyclopedia Britannica - Section on 7lags 1962 Edition (E.B)
5. Report of the national 7lags committee- P. 6 (R.N.F.C)

රතු පැහැය - දයාබොත්සාහය, මහජන හිතකාමී බව.

සුදු පැහැය - අවංක කම, සාමවාදී බව, සමානාත්මතාව.

කොළ පැහැය - නිර්භීත කම, විශ්වාසය හා නිදහස

තවත් මතයක් අනුව :-

රතු පැහැය - නිර්භීත කම, අප්‍රතිහත ධෛර්යය.

කොළ පැහැය - නිදහස

සුදු පැහැය - මිත්‍රත්වය, චරිතයේ පාරිශුද්ධ භාවය.

අඟවන බවත් සඳහන්ය.[6] එසේම සුදු පැහැය ගිවිසුමක් දැන්වීමටත්, රත් පැහැය අනතුරු ඇඟවීමටත් පාවිච්චි කල බවට නිදසුන් ලබාගත හැකිය.

කොඩිවල පාවිච්චි කරන ලද සංකේතවල ඉතිහාසය අවුරුදු දහස් ගණනක් පැරණිය. යුදෙව්වන් පාවිච්චි කල ඩේවිඩ් ගේ තරුව ( The Star of David ) ඊශ්‍රායලයේ කොඩියේ ඇත. කතෝලික රාජ්‍ය බොහොමයක ම කුරුසය සංකේතය ලෙස යොදා ගෙන ඇත. සාමයේ හා ජීවිතයේ සංකේතය හැටියට මුස්ලිම් රටවල කොඩිවල අඩසඳ හා තරුව පාවිච්චි කරනු ලැබේ. කොඩියක සඳහන් තරුවෙන් හැම විටම අවංක කම සංකේතාත්මකව පවසන ලදී.[7]

ලෝකයේ සමහර රටවල පොදුව එලෙසත් සංකේතය විවිධ පසුකාලවල නිරූපනය කල බවටද, නිදසුන් දිය හැකිය. මේ අනුව කොඩිය කුමන රටකද, එය දරන්නා කුමන ජාතිකයෙකුද, යන්න නිරූපනය කෙරේනා. ප්‍රංශවරු ලෝහිත වර්ණ කොඩියක සුදු කුරුසයක්ද, ඉංග්‍රීසීන් හා ජර්මන් වරු, සුදු කොඩියක ලෝහිත කුරුසයක්ද, පාවිච්චි කලහ. පසුව තම නාමයේ සාන්තු වරයන් හා සම්බන්ධ කොඩි පාවිච්චිය ඇති විය. සාන්ත ජෝර්ජ් ගේ කුරුසය දරන්නන්වන ස්වීය වශයෙන් එංගලන්තයේ පාවිච්චියට පැමිණියේ එලෙසිනි.

---

6. Report of the National Flag Committee P. 11

7. World book Encyclopedia P 171

W. B. E

ලෝකයේ බොහෝ රටවල ප්‍රචලිත වූ කොඩි ලංකාවේද අතීතයේ වෙනත් කරුණු සම්බන්ධයෙන් මෙන්ම කොඩි සම්බන්ධයෙන්ද භාරතයේ අදහස්වල බලපෑම ව්‍යාප්තය. භාරතයෙහි භාවිත වූ සංකේත මෙන්ද බොහෝ විට එම අදහස්ම භාවිත කරනු ලැබීම මේ බලපෑම වඩාත් ප්‍රකට කර පෙන්වයි. කුරු පාණ්ඩව යුද්ධයේ දී විවිධ සෙන්පතීන් භාවිත කළ සංකේත යෙදූ කොඩි ගැන විස්තරයක් මහා භාරතයේ එයි. පාණ්ඩ්‍ය, චෝල, චේර හා කේරල රාජ්‍යයන් තම කොඩිවල මත්ස්‍යයා, කොටියා, දුන්න හා සිංහ සංකේත වශයෙනුත් යෙදූ බව සඳහන්ය.

ක්‍රි: පූ: 3 වන සියවසේදී තැනූ සාංචි දාගැබ් දොරටුවේ ඇති සංකේතක කොඩිම ලක්දිව රාජකීය ලාංඡනය ලෙස හඳුනා ගත හැක.[8] මේ දොරටුවේ සියලුම හරස් බාල්කයේ මැද භාගයේ කැටයම්කර බෝධි වෘක්ෂයක් වටා පැවැත්වුණු පෙරහැරක් පෙන්වයි. එහි දෙපාර්ශ්වයේ එන කැටයම් වල දේවානම් පියතිස්ස රජතුමාගේ හා මෞර්ය වංශික අශෝක රජතුමාගේ රාජකීය කොඩිවල සටහන් වූ සිංහ හා මොනර රූප කොටා ඇත. එය සිංහල රාජකීය කොඩියේ මුල්ම ආකෘතිය ලෙස සැලකිය හැක.

මහා විහාරයේ ඇතුළු ශාලාසීම පවා සිංහයාගේ රූපයට අනුව සකස් කරන ලදැයි මහාවංශ ටීකාව කියයි. දඹුලු විහාරයේ දක්නට ඇති (මෑතකදී ඇඳ ඇති) දුටුගැමුණු කොඩියේ ඇත්තේද සිංහ ලකුණකි. 15 වන සියවසේද ජාතික කොඩියේ සංකේතය සිංහයා වූ බව පැරකුම්බා සිරිතේ එන පාඨයකින් පෙනේ.[9] මල්වත්ත විහාරයේ තිබී හමුවූ පුස්කොළයක "ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ කොඩියේ වූයේද දකුණතට කඩුවක් ගත් සිංහ සංකේතයකැ"යි ඊ. ඩබ්: පෙරේරා මහතා සිය ග්‍රන්ථයේ සඳහන් කරයි.[10] මේ කොඩිය ඊ. ඩබ්: පෙරේරා මහතා විසින් 1908 වෙල්ස් ආරෝග්‍ය ශාලාවේ තිබී සොයාගත් බවද එම පොතේ සංදර්ශනයේ දක්වා ඇත.

---

8. Buddhist Art in India - Grunwedel P 18, 28
9. පැරකුම්බා සිරිත - ශ්‍රී චාර්ල්ස් ද සිල්වා සංස්කරණය - 95 පැදිය
10. Sinhalese Banners and Standards - E.W. Perera. P 7

සිංහල රාජධානිය පැවති කාලය පුරා මෙම කොඩිය (සමහර විට වෙනස්කම් ඇතිව) පැවති අතර පසුකාලවලදී ජාතික, ආගමික හා අනෙක් හේතූන් උඩ විවිධ සංශෝධනවලින් යුත් කොඩි ලක්දිව භාවිතයට ආ බව රෝහණයේ කොඩි පරීක්ෂා කිරීමේදී පෙනී යයි.

## කාල සීමාව

පැරණි දේවාලේ ගැන ලංකාව කවදත් ප්‍රසිද්ධව ය හ. කොඩි ගැනද කවුරුන්ගේ සංයමය. එම කොඩිගැන විස්තර සොයන්නකුට ඇත අතීතයේ ස්ථම කොඩි හා නොයෙක් සංකේත අදහස් ඇතුළත් සඳහා භාවිච්චි කල බව පෙනෙන නිදසුන් බොහෝ හමුවනු ඇත. බොහෝ ප්‍රචලිත සිංහ කොඩියේ ප්‍රභාවයද විජය රජතුමාගේ කාලයේදීම සිදුවූ බව ඇතැම්හු විශ්වාස කරති. මේ සංකේතය සහිත කොඩි පසු කාලවලදී විවිධ රජවරුන් විසින් විවිධ අවස්ථාවලදී ද භාවිච්චි කල බවට නිදසුන් ඇත.

ක්‍රි: පූ: සියවස්වලට අයත් බෝවත්තගල සෙල්ලිපියකින් රුහුණේ දස බෑ රජවරුන් ගැන [11] කියැවේ. මත්ස්‍යයා ඔවුන්ගේ රාජ ලාංඡනය වූ බවද පෙනේ. කොටාදැමූහෙල හමුවූ සෙල්ලිපියකද මාලුවකුගේ සටහනක් සහිතව රජපෙලපතට අයත් පරම්පරා පහක නම් දක්වේ. පාණ්ඩ්‍ය, චෝල, චේර ආදී රාජ වංශවල රජවරුන් භාවිච්චි කරන ලද විවිධ සංකේත දැරූ කොඩි (සිංහල රජවරුන්ද) ඉන්දියා දක්වූ රාජ්‍යයන්ගේ බලපෑම් අනුව පසු කාලවලදී සිංහල රජවරුන්ද භාවිච්චි කරන්නට ඇත. ඉරහඳ රාජකීය ලාංඡනය ලෙස සැලකුව හොත් එය අපේ පැරණි සෙල්ලිපි රාශියක කොටා ඇති බවින්, පැරණි රජවරු එම සංකේත භාවිච්චි කල බවත් ස්ථිරය හැකිය.

මුල් යුගවලදී රාජකීය සම්මාන ලෙස ප්‍රාදේශීය රජවරුන්ට හා ප්‍රධානීන්ට මහ රජතුමා විසින් දෙනු ලැබුවේද නාම භාවිච්චි කල සංකේතම බව පෙනේ. එහෙත් කාලයාමේදී මෙම ක්‍රමය වෙනස් වී ගොස් විශේෂ නාම අවස්ථාවක් හැදෑරූ විට ආසනයනට පවරා දුන්නේ වෙනත් සංකේත දැරූ කොඩි බව, නිදසුන් පරීක්ෂා කිරීමේදී පෙනේ.

---

11. Ceylon Journal of Science and Geology - Vol II p 99

ක්‍රි: ව: 1303 දී පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා අලුත් නුවර විෂ්ණු දෙවියන් උදෙසා දේවාලයක් ගොඩ නැගූ බවත් පෙරහැරේ ගෙනයනු සඳහා ඉර හඳ කොඩිය දුන් බවත් යටවර බස්නායක නිලමේ කියයි[12] ඊ. ඩබ්: පෙරේරා මහතා සිය ග්‍රන්ථයේ සඳහන් කරයි.

මයුරයෝත් ඇතැම් සැලුලෙන් කොලවරවූ සංදේශ මංලාවේ කොඩිගැන විස්තර දක්වූ තැන් බොහෝය. එහෙත් ඒවා වැඩිපුර සඳහන් ව ඇත්තේ "දද" යනුවෙනි. සවිස්තරව කොඩි ගැන දක්වූ තැන් ඒ ඒ ස්ථානවලට අදාල වන අයුරෙන් අවස්ථානුකූලව මතු දක්වනු ඇත.

හයවැනි පරාක්‍රමබාහු රජතුමා පසළොස්වැනි ශත වර්ෂයේ මුල්කාලයේදී ලංකාද්වීප ඒකසේසත් කළවිට ඒ ඒ ප්‍රදේශ ප්‍රාදේශීය පාලකයාට පවරා ප්‍රාදේශීය කොඩි දුන් බව පෙනේ. මේ නිසා ප්‍රාදේශීය කොඩි භාවිතය මෙම ශත වර්ෂයේසිට පටන් ගත් බවත් කිව හැකිය.

දොන් ජුවන් ධර්මපාල (1551 - 1597) දී ලංකාව පහත සඳහන් රාජධානිවලට හා පළාත්වලට බෙදූ බව එක් ග්‍රන්ථයක[13] සඳහන් වේ. ඒ මෙසේය. යාපනය, සීතාවක, සෙංකඩගල හා සත්කෝරළේය. පළාත් හැටියට සතරකෝරළයේ මාතර, දෙනවක හා නුවර කලාවිය ප්‍රදේශ සලකනු ලැබීය.

පහතරට ප්‍රදේශ පෘතුගීසීන් හා ඕලන්දයින් විසින් අල්ලාගත්තාට පසු, මහනුවර රජ තම ප්‍රදේශ නැවත කුඩා කොටස්වලට බෙදා ඒවාට කොඩි ප්‍රදානය කර ඇත. එම බෙදීම් මෙසේය. මහ දිසා හැටියට ඌව හා මාතලේ සැලකූ අතර, හත්කෝරලය, වලපනේ, උඩපලාත වෙල්ලස්ස බින්තැන්න හා තමන්කඩුව කුඩා ප්‍රදේශ හැටියට සැලකිණි. සතර කෝරලය කෝට්ටේ රාජධානියෙන් විදුනාට පසු සෙංකඩගල, රාජ්‍යයේ ප්‍රධාන දිසාව බවට පත් විය.

---

12. Sinhalese Banners and Standards - E. W. Perera P. 17 (SBS)

13. Orientalists Vol III P 194

බුදු සමයේ පුනර්ජීවයක් ඇති කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (1748 - 1778) නුවර රාජ්‍යය පුරා පන්සල්වලට දීමනාවක්ද පෙරහැරවල් ප්‍රතිසංවිධානය කොට විහාරවල උත්සව සඳහා කොඩිද ප්‍රදානය කළ බව කියවේ. මහනුවර රාජධානිය බිඳ වැටෙන්නට පෙර මෙවැනි ප්‍රදානයක් කළ අවසාන වතාව මෙයයි. අප පරීක්ෂණයට භාජනවන ප්‍රදේශයේද ඇති කොඩිවලින් බොහොමයක් මෙම කාලයේ සිට පැවත එන බවද නිර්ණය කළහැක්කේ ඉහත සඳහන් කළ කරුණු ආශ්‍රයෙනි.

දහ අට වැනි ශතවර්ෂයේ කළ මෙම ප්‍රතිසංවිධානය මහා වංශයේ විස්තරාත්මක ලෙසම සඳහන් වේ. " බුදු නාම නගරයට ලංකාවේ වැසි ජනතාව එක් රැස් කරවා පළින් හා නායකයින් ඇතුව කොටස් කර නගරයේ එක් එක් දිශාවේ නවත්වා එක් එක් කොටසට වෙන වෙනම කොඩි ප්‍රදානය කළේය.[14]

1828 දී බාන්ස් ආණ්ඩුකාර තුමා මහනුවර පෙරහැරක් සංවිධානය කළේ ප්‍රභූවරයන් සතුවූ දළදා වහන්සේ නැවත රදළවරුනට භාරදීමේ උත්සවය නිමිත්ත කරගෙනය. මේ කරුණ දළදා පූජාවලියේද සඳහන්ව ඇත.

ඊ. ඩබ්. පෙරේරා මහතා ස්වකීය ග්‍රන්ථයේ පස්වන පරිච්ඡේදයේ සඳහන් කරන හැටියට උඩරට රදළවරුන් හා රජවරුන් ඉදිරියෙහි ගෙන ගියේ චතුරස්‍රයන් දෙගුණයක් දිග පතාක් පළල කොඩිය. (චතුරස්‍රයක සම්මත දිග අඟල් 36 කි.)

රාජකීය ලාංඡන වෙනස් මුහුණුවරකින් හඳුන්වා දුන්නේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසු බව පැහැදිලිවම කිව හැකිය. එමෙන් පසුදී මුල් සම්ප්‍රදාය දේශීය වූ ආකාර, විදේශීය කොඩි ඇතුව ක්‍රම ක්‍රමව වෙනස්කම්ද ඇතිවූ බව පෙනේ.

දුරාතීතයේ සිටම කොඩි පාවිච්චිය ගැන සටහන්, එවිට මූලාශ්‍රවල ඇතත් සවිස්තර ලෙස කොඩි පැවතීම ගැන සඳහන් වන්නේ[15] වැනි ශත වර්ෂයේ සිට බැවින් මෙම ග්‍රන්ථයට අදාළත්වන කාල පරිච්ඡේදය පසළොස්වැනි සියවසේ සිට දහනව වැනි සියවසේ මුල්භාගය දක්වා කාලය සීමාව ලෙස ගන්නට සිදුවේ.

---

14. මහා වංශය 99 පරිච්ඡේදය - 43- 46 ගාථා

15. Sinhalese Banners and Standards - E.W. Perera. P. 25

## දේශ සීමාව

රෝහණ ජනපදයේ ආරම්භය, ක්‍රි: පූ: සිව්වන සියවසේදී පමණ පැමිණි භද්දකච්චායනා කුමරියගේ සොහොයුරු, රෝහණ කුමරු ජනපද පිහිටුවීම නිසා සිදුවී යැයි මහාවංශය කියයි.[16] එහෙත් මෙම ජනපදයේ නිශ්චිත දේශ සීමාව මේ යැයි ස්ථිර වශයෙන් කිව හැකි නොවේ.

පණ්ඩුකාභය රජුගේ දසවැනි රාජ්‍ය වර්ෂයේදී මුළු ලංකාවේම ග්‍රාම සීමා නියම කළ බව මහාවංශයෙහි[17] සඳහන්වේ. එද නිශ්චිත වශයෙන් මෙපරිදි යැයි සාක්ෂි ප්‍රබල නැත.

ගෝඨාභය යුග කාලයේදී රුහුණු රටේ උතුරු දේශ සීමාව කලාඔය, කුඹුක්ඔය, හා මහවැලි ගංමෝය නොහොත් පැවති බවත්, බටහිර දේශසීමාව වූයේ මලය කඳුවැටිය බවත්[18] සිරිමල් රණවැල්ල මහතා ලියූ ලිපියකින් පෙන්වා දෙයි. එසේම රුහුණු රට කැළණි රාජ්‍යයෙන් වෙන්වූයේ කළු ගඟෙන් බව[19] සාහිත්‍ය සඟරාවට සපයා ලද ලිපියකින් ඒ මහතා පවසයි. "මාන්දාරම්පුර පුවත" නම් ග්‍රන්ථයේද රෝහණයේ දේශ සීමා ලෙස දක්වා ඇත්තේ [illegible] ඉහත සඳහන් අයුරෙන්.

දුටුගැමුණු රජුගේ ලංකාව එක්සත් කරනු ලැබීමෙන් පසුව වුවද රුහුණු රටේ දේශ සීමාවක් වෙනස් වූ බවක් නොපෙනේ. මේ රජු රුහුණු රටේ පාලකයාව සිටි කාලයේ පැවති රුහුණේ දේශ සීමාවත් අටවැනි සියවසේ අවසානය දක්වාම වගේ වෙනස් නොවුණු බවට සාධක ඇත.

---

16 මහා වංශය - IX පරි. 10 ගාථාව

17. මහා වංශය - X පරි. 103 ගාථාව.

18. වෛශාඛ්‍යා ලේඛන සංග්‍රහය. අංක 2 - 1962 ජූලි - පිටු 41-46-48-58

19. සාහිත්‍ය කොමසාරිස්. සාහිත්‍ය දින විශේෂ කලාපය - 1962 - පිටු 45

" මහවැලි ගඟත් කළු ගඟ සහ සිඳු කොට
ඉම් කළ රට රුහුණ යයි පෙර සිට කියනා."

පද්‍ය - 4

1017 දී සොලීන් ලංකාවෙන් විශාල කොටසක් අල්වා ගත් පසු අගනුවර වූයේ පොළොන්නරුවයි. එහි පසුව රුහුණු රටේ උතුරු දේශ සීමාව මහවැලි ගඟ විය. "I වැනි පරාක්‍රමබාහු රජතුමා මහවැලි ගඟ සැම තොටුපළකම බලසේනා තැබූ බව කියා[20] චූලවංශ පාඨය අනුවත් රුහුණු රට හා රජරට වෙන් කළ දේශ සීමාව මහවැලි ගඟ බව සිතිය හැකිය. I වැනි පරාක්‍රමබාහු රජුන් අනුපරිදි රුහුණු රට අල්වා ගැනීමට අදහස් කළ සෙනෙවියන් නව යොදුන් රට හා කලිඟර්කාණ්ඩ රටත් අල්ලා ගත් බව" මහා වංශය කියයි.[21]

"මෙම ගොවියන්ගේ රාවල් වූ මහා නිර්යාම රට හා පස්යොදුන් රටත්, නවයොදුන් රට හා කලුගල්බඩ රටත් පිහිටා ඇත්තේ කලුගඟ අසබඩය."[22] මේ අනුව පොළොන්නරු යුගයේදී ද රුහුණු රට හා මායා රට වෙන් වූ ප්‍රධාන දේශ සීමාව කළු ගඟයි. මහවැලි ගඟටත් කළු ගඟටත් දකුණින් ගොළු මුහුද දක්වා වූ මුළු ප්‍රදේශයම පොළොන්නරු යුගයේදී රුහුණු රටට අයත් වූ බව පෙනී යයි.

1233 දී පමණ සිංහල රජුන්ගේ අගනුවර මාඝගේ ආක්‍රමණය නිසා මායා රටට ගෙන ගිය බව දනිමු. 16 වන සියවසේ මැද භාගය තෙක්ම සිංහල රාජ නගරය පිහිටියේ මායා රටේය. මේ කාලය තුළදී වරින් වර දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, රයිගම, කෝට්ටේ යන ස්ථාන වලට රාජ නගරය මාරු වූ බව පෙනේ. මෙම කාලයේදී දේශ සීමා ගැන අවබෝධයක් ලබා ගැනීමට කඩයිම් පොත් බොහෝ උපකාර වෙයි. එක් කඩයිම් පොතක රුහුණු රටේ දේශ සීමාව දක්වන්නේ මෙසේය.

"සමන්ත කූට පර්වතය පටන් මා ලංකා කාන්තාරය ඇතුළත් සොළොස් ගව්වක් ඈත. පහළට ජලධාරා ඇතුළත් වනුයේ. එතෙන්ට රුහුණු, මායා, පිහිටි ත්‍රී සිංහලය වන්නේය."

---

20. මහා වංශය - 71 පරි: 6 - 18 ගාථා
21. මහා වංශය - 72 පරි: 56 - 62 ගාථා.
22. JRAS (CB) VOL VI - pp 199, 123, 126

රුහුණු රටේ කඩයිම් කෙසේද යත් :- රේමුණු ඇල්ලෙන් උඩ, මාදම්පෙ මුදු වෙරළෙන් උඩ, ගොඩයාපාන මුහුදට වැටෙන තැන, මුහුදු වෙරළේ පුල්ලයන් දූවේ කොටු බැම්මෙන් උඩ, මඩකලපුවේ කොටු බැම්මෙන් මහවැලි ගඟ මුදට වදින තැන, මහා වටුවං තොටින් එගොඩ, හෙඩරව ගං මුවුරෙන් එගොඩ, අඳුණ රාතොටින් එගොඩ, කුඩාබසාලෙන් එගොඩ, ඉල්විල්ලෙන් එගොඩ, වටපුයවේ තොටෙන් එගොඩ, ගැටබේ කොටුවලෙන් උඩ, පේරාදෙනියේ අත්තා ගඟ කඩුල්ලෙන්, මී වතුරෙන් උඩ, අඹගමුවේ තොටෙන් උඩ, කොරවක් ගඟ හමුවූ තැන දෙක්දෙන් උඩ, මැද්දුම රට රුහුණු රටයේ දැන ගත යුතුයි.[23]

ගම්පල යුගයේදී හෝ ඊට පසුව ලියන ලද්දැයි සැලකිය හැකි කඩයිම් පොත්වලින් පසුකාල රුහුණු රටේ මායිම් වශයෙන් සඳහන්, කොත්මලේ රට හා මහවැලි ගඟ පැවති බව සැලකිය හැකිය.

රුහුණු රට වෙනම පාලන කොට්ඨාශයක් වශයෙන් පැවති යුගය අවසාන වූයේ දහසය වන සියවසේදී ලංකාවේ මුහුදු බඩ පළාත් පෘතුගාලි වරුන්ට අයත් වූ පසුය. ඊට පසු ඔවුන්ගේ දිසාවන් බෙදී ගියේ කොළඹ මඩස ගත කාරගෙනය. රුහුණු යනුවෙන් දිසාවක් නොවීය. එසේම, මාතර දිසාවනියට, රුහුණ මුළුමනින්ම අයත් නොවීය. ලන්දේසි සමයේදී ද ඔවුන්ගේ ප්‍රදේශ මුහුදුබඩට පමණක් සීමාවූ නිසා පෙර දක්වූ රෝහණය භාගයෙන් එක කොටසක්වත් ලන්දේසීන්ට අයත් වූයේ නැත.

ලංකා ඉතිහාසයෙන් වැඩි කාලයක් තුළදී රෝහණය වශයෙන් සලකන ලද්දේ, උතුරින් මහවැලි ගඟටත්, බටහිරින් කළු ගඟටත්, නැගෙනහිරින් හා දකුණින් මහ මුහුදටත් මැද්වූ ප්‍රදේශයයි. රෝහණ ඉතිහාසයෙහි පැවතු මායිම් වූයේත් එවාමය. එහෙයින්, මේ නිබන්ධයෙහිදී රෝහණයෙහි දේශ සීමාව වශයෙන් සලකා ලද්දේද එයමය.

---

23. මාතලේ අලුවිහාරයට අයත් වූ ත්‍රී සිංහලේ කඩයිම් පොතෙන්.

විෂය සීමාව

පුරාණයේ සිටම රජවරුද කොඩි පාවිච්චි කළ බවට මෙන්ම ඒ ඒ ස්ථානවලට හා පුද්ගලයන්ට රාජකීය ගෞරවය ප්‍රකාශ කිරීම වශයෙන් කොඩි දුන් බවද, පෙරහැරවල්වල කොඩි ගෙනගිය බවද සාධක ඇත. එහෙත්, සත්‍ය වශයෙන්ම මේ සිදු කළ බවට ලේඛන හා සාක්ෂි දක්විය හැක්කේ දහහත්වැනි සියවසේ සිටය. මෙම පොතට අදාළ වන කාල සීමාව මහනුවර යුගයේ සිට දහනමවැනි සියවස දක්වා බව මෙහි දක්වන ලදී.*

උඩරට රාජධානිය කෙළවරට පැමිණීමට පෙර අවසාන වතාවට කොඩි බෙදා දුන්නේ 1748 - 1778 දක්වා රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා බව[24] ඊ. ඩබ්. පෙරේරා මහතා සිය ග්‍රන්ථයේ සඳහන් කරයි. මහාවංශයේ 99 වන පරිච්ඡේදයේ 43- 46 ගාථාද මෙම සිද්ධිය විස්තර කරයි.

එක් එක් ප්‍රධාන කාලවලදී කොඩි ප්‍රමාණය කර ඇති බව පෙනේ. එහෙත් මුලින් දුන් කොඩි, විදේශීය බලපෑම් අනුව කාලයාමේදී වෙනස් වූ බවට නිදසුන් පසුව දැක්වේ. භුවනෛකබාහු (1300) රජු සමයේදී මෙහි පැමිණි මුල්ම සංචාරක පෘතුගීසීන්ට දී තිබුණ කොඩියට වඩා වෙනස් කොඩියක් ඔවුන් එසේම ලන්දේසීන්ද සමයේදී භාවිතා කොට ඇත. ඔවුන් පසුව කාල කැඩුණු කාලයේ රජුගේ අනුකූලව මෙය ප්‍රධාන ලක්ෂණ වෙනස් වී ඇත.

කාලය කාලයේද කොඩි කාලෝචිත අංගම අනුව වෙනස් කම් වලට භාජනය වූ බවට නිදසුන් දැක්විය හැකිය. පසු කාලයකදී සිංහල කැරැල්ලක් ඇති වෙන ස්ථානයේද මේ නිසා සිද්ධ විය හැකිය.

විදේශීය ආධිපත්‍යයට යටත් වූ පසු ලංකාව වෙන් වෙන් කොටස් වශයෙන් හැඟී සිටීමට ඉඩමාංචුවක් නොවූයේ පොදු සතුරා ඉදිරියේ කොටසක් වී සිටීම අනතුරුදායක බව පෙනීගිය හෙයිනැයි සිතිය හැකිය.

---

* වන පිට බලන්න.

24. Sinhalese Banners and Standards E. W. Perera P. 24

මෙවැනි හේතූන් නිසා, විදේශීයයන්ගේ පැමිණීමෙන් පසු ගෝත්‍රික හැඟීම් යටපත් කර ආගමික උත්සව වලදී පමණක් විවිධ දෙපාර්තමේන්තුවලට හා දිසාවලට අයත් කොඩි පාවිච්චි කල බවට නිදසුන් ආශ්‍රයෙන් තීරණය කල හැකිය. කුල සම්බන්ධයෙන් දුන් කොඩිද අභාවයට ගියේ එවාගේ අවශ්‍යතාවක් විදේශීයයන්ගේ පාලන සමයේ දී ඇති නොවූ නිසා විය හැකිය.

ඉහත සඳහන් කරුණු පදනම් කොට මෙම ග්‍රන්ථයේ විෂය සීමාව පහත සඳහන් ආකාරයට සකස් කෙරේ. දීර්ඝ ප්‍රස්තාවනාවකින්ද, කොඩි වර්ග කොට දැක්වෙන පරිච්ඡේද පහකින්ද, කොඩිවල කලාත්මක අගය විග්‍රහ පරිච්ඡේදයකින් ද ග්‍රන්ථය සකස් කෙරෙනු ඇත.

ප්‍රස්තාවනාවේ දී මෙම ග්‍රන්ථයට අදාල වන කාලසීමාව, ප්‍රදේශ සීමාව, විෂය සීමාව ගැනත් එ සීමාවන් තෝරා ගැනීමට හේතුවූ කරුණු ගැනත් සඳහන් කරනු ඇත. ඊට පසුව වන කොටස්වල කොඩි කුමන දෙයන් ප්‍රභවය ලැබීද, විවිධ සංකේතයන් ගෙන් අදහස් කල කරුණු, එවා පාවිච්චි කල විවිධ අවස්ථා හා පරමාර්ථ, කොඩි වර්ග කිරීම, ලංකාවේ කොඩිවල දැක්වෙන සංකේත, එවා කොඩිවලට ඇතුලත්වූ හේතු, සිංහ ලාංඡනය හා එය තනි සංකේත අනුව ඇත්කර තිබූ විචිත්‍රත්වය, දිසා කොඩි, දෙපාර්තමේන්තු කොඩි, ආගමික හා ගෝත්‍රික කොඩි ගැන ඉහත සඳහන් කල පරිච්ඡේද පහේ ඇතුලත්වන කොඩි ගැන හැඳින්වීමක් වශයෙන් තොරතුරු ඇතුලත් වනු ඇත.

මෙම භාගයේ දෙවන කොටසේ පළමුවන පරිච්ඡේදයේ රෝහණ දේශසීමාව තුළ භාවිත සිංහ කොඩියත්, එහි යොදා ඇති විවිධ සංකේත හා එවා පාවිච්චි කල අවස්ථාවන් ගැන විස්තරයක් කෙරේ. මෙම පරිච්ඡේදයේ සඳහන් වන කොඩි ආශ්‍රයෙන් කඩුව හෝ කසය හෝ මල් ඇත්ත හෝ තනි සිංහ ලාංඡනය පමණක් ඇති කොඩිවලින් අදහස් කරන විවිධ මත පිළිබඳ විමසුමක් ඇතුළත් වෙයි.

---

දෙවන පරිච්ඡේදයේ දී දිසා කොඩි වර්ග කොට එක් එක් දිසාවලට එවා ලැබුණ අයුරු, විද්‍යෝදය පිරිවෙනේ ශ්‍රී සුමංගල ශාලාවේ සීලිමේ දක්වෙන කොඩිත් එම කොඩිවල දක්වෙන සංකේත ගැන විස්තරත් ඒ හා සමාන කොඩි අතර සංසන්දනයකුත් ඇතුළත් වනු ඇත.

තුන්වන පරිච්ඡේදයේ දී පැරණි රජවරුන් දවස භාවිත වූ දෙපාර්තමේන්තු කොඩි ගැන විස්තරයක් සපයන අතර, එවා දැන් සොයා පරීක්ෂා බලනු ඇත. මේ කාර්යය සඳහා උපයෝගී කරගනු ලබන්නේ මහාර ගුලංගම්කෝන් එසලවලව්ව, කබුරුපිටියේ විල්ලේගොඩ විහාරස්ථානයේ පරම්පරාව දක්වෙන කුස්කොළයේ රාජ පරම්පරාවේ කොඩි, ඊ. ඩබ්. පෙරේරා මහතාගේ කොඩි පොතේ දක්වෙන කොඩි ලැයිස්තුවකිය.

හතරවන පස්වන පරිච්ඡේදවල දේවාල හා ආරාමවලට විශේෂවූ කොඩි හා එවායේ සංකේත පිළිබඳ, විස්තරද, එක් එක් කාලය අනුව වෙන වෙනම විශේෂ කොඩි දැන් බවද, එවා රෝහණයේ විසිර තිබෙන අයුරු පිළිබඳවද, පසුව මෙම කොඩි විදේශීය බලපෑම නිසා වෙනස් වී ගිය අයුරු පිළිබඳව විස්තරද ඇතුළත් කරනු ඇත. අවසාන පරිච්ඡේදයේ කොඩිවල කලාත්මක අගය ගැන විස්තරයක් ඇතුළත් වේ.

කොඩි පාවිච්චි කල විවිධ අවස්ථා හා පරමාර්ථ

විවිධ ජාතීන් සංවිධිතවූ පසු කොඩි දැරීමෙන් තම කොඩිය කුමන රටකට අයත්දැයි පමණක් නොව තම දරන්නා අයත් ජාතිය කුමක් ද යන්න ද නිරූපණය කරන බව මා පෙර සඳහන් කොට ඇත. කොඩි, යුද්ධයේදී පමණක් නොව වෙනත් අවස්ථාවන්හිදී ද පාවිච්චි කොට ඇති බව සඳහන් වේ.

චීනයේ මෙන්ම භාරතයේද සංඥා දීම සඳහා කොඩි පාවිච්චි කර ඇත. චීනයේ රජවරුන් දෙදෙනෙකු 1542 දී සුදු කොඩිය, ගිවිසුමක් දැක්වීම සඳහා පාවිච්චි කල බව සඳහන්ව ඇත.[25] මෙසේ ඇතිවූ භාරත හා චීන සිරිත්, බුරුමය, සියම හා අග්නිදිග ආසියාව ආදී රටවලට ද, පැතිර ගිය බව වැඩිදුරටත් එම ග්‍රන්ථයේ සඳහන් වේ.

මුල්ම යුගයේදී කොඩි පාවිච්චි කළේ යුද්ධ කටයුතු සඳහා වුවත් පසු කාලයේ දී ඒවා වෙනත් අවස්ථාවලදී ද පාවිච්චි කොට ඇත. නායකත්වයේ සලකුණ වශයෙන් ද, සතුරන් මිතුරන් හඳුනා ගැනීමේ සංකේත වශයෙන්ද, ඓශ්වර්ය යුක්ත සරාගා ඇඟවීමක් වශයෙන්ද, කොඩි පාවිච්චි කරනු ලැබීය. යුද්ධ හමුදා ගමන් ඇරඹීමේ සලකුණ ලෙස කොඩි දිග හැරි බව, යුද්ධ පිළිබඳ ලියූ සියම් ග්‍රන්ථයක සඳහන් වෙතැයි, එන්සයික්ලොපීඩියා බ්‍රිටැනිකා ග්‍රන්ථය කියයි.[26] දැනට වැඩි වශයෙන් කොඩි පාවිච්චි කරනුයේ සංඥා දීම සහ සැරසිලි සඳහා බව පෙනේ.

රාජකීය හා ජාතික කොඩිවලට අමතරව පවුල්වලට පමණක් සීමාවූ කොඩිද, තම තත්වය ප්‍රකාශ කල කොඩිද තිබිණි. කොඩියේ ප්‍රමාණය ඉතා විශාල නම් එය සුලඟේ ලෙලදෙවන්නට අදහස් නොකල බව සිතිය හැකිය.

---

25. Encyclopedia Britannica - Section on Flags 1962 Edition (E.B)

26. " " " " "

එක් තැනෙක සේකල මෙය යුද්ධයකට පෙරාතුව හෝ පහරදීමකදී බහු ස්වන නාද හෝ උත්සවයකදී බහු ස්වන නාද හෝ සලකුණු කළ බවට සිතිය හැකිය. එසේම, රාජකීය කොඩිය මාලිගයක, ආධාරකාරක නැව, කුඩාරමක හෝ නැවක හෝ සවිකොට තිබුණු නම් එයින් එහි රජතුමා සිටි බව ඈත් ඈතට දැනගත ලදී.

දේව විශ්වාස ගැන පුරාවෘත්තයක් උපුටා දක්වන භාරතීය විදෙස් කොඩියක්, අඳියෙන් දෙවියන් ආකාරෙන් නිරූපණය කරයි. පිරුවානා පොතේ සඳහන් වන ධජග්ග පරිත්තයෙහි සඳහන් දඹදිව දෙවියන් ධ්වජ පාවිච්චි කළ බවද, ඒවායින් අනුගාමිකයනට ධෛර්යය හා ප්‍රාර්ථනාය ලැබුණු බවද කියැවේ.

ඒ ඒ දෙවියන් අනුව ගිය සෙසු පිරිවර දේවතාවනට කෙරෙන නියෝගයක් ධජග්ග පරිත්තයේ [27] පාඨයෙන් පෙනේ. සටන් වැදි දෙවියකුගේ සිත භයෙන් තැතිගත වූයේ නම් එයින් එම භීතිය දුරුවනු සඳහා ධෛර්ය ලබනු සඳහා දෙව්රජුන්ගේ ධජය නැරඹිය යුතුයයිද, එක් එක් නමින්ම කියැවේ. එක කොඩියක් දෙස බැලීමෙන් බිය පහවූයේ නැතිනම් තවත් දෙවියකුගේ කොඩිය දෙස බලන්නැයි ද නියෝග කෙරේ. මෙයින් තවත් කරුණක් පැහැදිලි වේ. ඒ එක් එක් දෙවියාට වෙන වෙනම කොඩි තිබූ බවත්, එම කොඩිවලින් විවිධ භීතීන් පළවාහැරුණු බවත් සිතිය හැකිය. මෙම නියමය ගැන ලක්දිව සැලකිල්ලක් දැක්වූ බව පිරුවානා පොතට ඇතුළත්කරවීමට නැති යනුවෙන් ආවරණයක් සපයීමෙන්ද පෙනේ.

---

27. අථ ඛො සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. සචෙ
මාරිසා දෙවානං සඞ්ගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා, ඡම්භිතත්තං වා ලොමහංසො වා,
මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ ......
නො චෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ..... අථ වරුණස්ස දෙවරාජස්ස
ධජග්ගං උල්ලොකෙය්‍යාථ. වරුණස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ.
යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති. නො චෙ
වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. අථ ඊසානස්ස දෙවරාජස්ස
ධජග්ගං උල්ලොකෙය්‍යාථ. යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා
සො පහීයිස්සති.

මද්ව කතා අනුව කොඩි භාවිච්ච කල දෙව්වරුන්ගෙන් ලක්ෂම ප්‍රසිද්ධ නැගෙනහිර ආරංගයාය. බුදු මහසෙන් රූපය සහිත කොඩියක් දරූ බව සාහිත්‍යයේ හරහා පෙනෙයි. මේ නාගම මොහුට මින්දද, මුවරද, යනුවෙන් නම් දෙකක් ද වේ. මල්සරා පමණක් නොව අන්කුන් දෙව් වරුද කොඩි දරූ බවට සාධක තිබේ. වෛශ්‍රවණ සංකේතයද ධජ ලක්ෂණයක්.

මට හමුවූ මෙහෙයවන රණපතියා විසින් ගන්නා ලද කොඩිය ලෙල දෙන තුරු සෙසු සටයෝ ධෛර්යමත්ව සටන් වදිති. වජගා පරිහාරයෙහි දෙවියන් පිළිබඳව පැවසෙන්නේ පැරණි දඹදිව මිනිසුන් තුළ පැවති සරිතක් බව පෙනේ. පැරණි භාරතයේ බලවත් හේතු කීපයක් අතර විශේෂයෙන් කුරු පාණ්ඩව යුද්ධය පිළිබඳව වීර කාව්‍යයක් ද මහා භාරතයේ අඩංගු වේ.

"සචකීය යුද්ධ රථයේ නැංවූ සාම් ධජය ගගනතලයෙහි ලෙලදෙද්දී"

(භාරත ගීතය 387)

"බලවු අර්ජුනයෙන්"

"කෞරවයන්ගේ භාරතා, බඳු, සූර්ය හා සටහන් ඇති කය, සුදු, කහ මදුරිය පැහැති කොඩිද කුඩා සමුතෘද්යද යුද්ධ භූමියේ විසිරී තිබෙන සැටි."

"ත්‍රිපුර මහා භාරත සංක්ෂිප්ත"

මෙවැනි ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති කොඩි ලංකා වංශ කතාවල සඳහන් වන්නේ විජයාගමනය හා සමගම ය. විජය හා විරස සිංහලයන් යස හඳුන්වීමට පටන් ගත්තේ මවුන් සිංහ රූපය සහිත කොඩියක් ජය ජෛත්‍ය සංකේතය කොට ගෙන සිව් වසර යළිද විශේෂ කල නිසාය. විජයගෙන් පසුව කොඩි, දද, පතාක භාවිතාව අවසන් මේ රටේ වංශ කථා හා සාහිත්‍ය ග්‍රන්ථ ලේ හොඳුව පෙනෙයි. මෙහි ආ විදේශිකයෝද ඇතැම් විට මෙම කොඩි ගැන ලියා ඇත.

සාහිත්‍යසූරි
ආචාර්ය ඩබ්.ජී.පී.අභයවර්ධන
අභය [illegible],
69.පී.එච්.පෙරේරා මාවත,
බොරලැස්ගමුව.

මහා විහාර සීමාව ලකුණු කිරීම සඳහා ගමන් ගත් පෙරහැර විස්තර කරන මහා වංශය "තොරණ් වියනේ වර්ණවත් වූ ද, ජත්‍රත් වූ ද, ධජ"[28] ගැන සඳහන් කරයි. ලෝවාමහා ප්‍රාසාද ගොඩනැගීම යන ඡේදයේ "පළිඟු වහලයෙහි රිදී සවන් යුක්ත වූ සේසත තොරණයේය. මෙම ප්‍රාසාදයේ අන්තයේ සතර වට රත්නයෙන් කරන ලද අෂ්ට මංගලිකාකාර රූපයෙන් ද"[29] යන කොටස අනුව, අෂ්ට මංගල වස්තුවලින් සමන්විත වූ කොඩියද මෙසේ නිරූපනය කර තිබුණා බව පෙනේ." දුටු ගැමුණු රජ. ස්වය ජය කොන්තය සහ හැඩගත සමුවා ගියේය. එය යෝධයන්ට පවා සතුරන් සොලවාලිය නුහුණු හෙයින් ඔසැදා වෙහෙරක් කරවන ලදී."[30] මහා වංශය මෙහා ජය කොන්තය ගෞරවෙන් සලකන්නේ කුන්තායුධය සංකේතය දක්වන කොඩිය සඳහා හෙලිලය. ජාතීන්ගේ දේශනා වාර්තාවේ අනුව තර විහාර දන්නා බව බුද්ධිගය විස්තර කරන හැම නගර වීථි, ධජ, පතාක, සේසත් වලින් අලංකාර කරන ලද බව පෙනේ.

මධ්‍යකාලීන යුගයේදී ලංකාවේ ප්‍රචලිතව පැවතුණේ ඒ ඒ ප්‍රදේශවලට විශේෂ වූ කොඩිය. ජාතික කොඩියෙහි වෙසෙස ගණනක් කොඩියක් පසමයේ නොතිබුණදැයි අදහස විචාරකයෝ ඇසූහ. නුවර පෙරහැරේ ගොඩගිය කොඩි ගැන "මධ්‍යකාලීන සිංහල කලා" යන ග්‍රන්ථයේ 38 වැනි පිටුවේ ආනන්ද කුමාරස්වාමි මහතා සවිස්තරව දක්වා ඇත. එය ද දක්වෙන්නේ ද්වජ හා පුද්ගල කොඩි ගැන විස්තරයකි. විශේෂ වූ ජාතික කොඩියක් මෙසේ සඳහන්ව නැත. ඒ බව එම කොඩි විමසා බැලීමෙන් පෙනෙන අතර, එම ලේඛනය අනුව රජයේ කාර්යාලවල ඇති ජදිවෙල එක් මතක් දක්වා ඇතැයි සිතිය හැකිය.

---

28. මහා වංශය - 15 පරි - 194 ගාථාව - පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්කරණය.
29. මහා වංශය - 27 පරි - 37 ගාථාව - " " " "
30. මහා වංශය - 26 පරි - 11 ගාථාව - " " " "

පැරකුම්බා සිරිතේ 91 වන කවියේ "ඇඳි සිහ දද" යන පාඨය අනුව ජයවර්ධන පුර ප්‍රාකාර මහා සමන පැරකුම්බාවන් අතින් ගෙන ලද සිංහ කොඩියක් තිබුණ බවද පෙනේ. ජයවර්ධන පුර කෝට්ටේ රාජධානියේ අලකේශ්වර රජයාට පුල්ලි මුඛම් (කොඩි මුතුණ සහිත) ධ්වජයක් තිබුණ බව නිකාය සංග්‍රහය පාඨයෙන් පෙනෙයි.

ජයවර්ධන පුර කෝට්ටේ ~~[illegible]~~ සාහිත්‍ය සමයේ මෙන්ම, ඊට පෙරද ලියූ සන්දේශ කාව්‍යවල ධජ, පතාක ගැන බොහෝ සඳහන් වේ. ජනාකීර්ණ වීථිවලින් අලංකාර නගර වර්ණනය

"අඹර ඇඹරී දද සෑම් ජස යතු කොවැසි.
තිසර සොඳුරු පුරු ජිරියම් කැරෑ මැසි"

යයි ගිරා සන්දේශ කාරයෝ කියති. "දද" යන පොදු නමින් මේවා හැඳින්වූ හැටි කීයයුතු. ඒත් සමහරක් මෙසේය.

සැලළිහිණි සන්දේශය :- [31]

"විපුලී තර සොමෙර බඳ රන් දද සැස ල" - 10 පැදිය.
"කවිචැලේ කපුරු ප්‍රමැ කැල ලෙලෙලන දද පෙල" - 21 පැදිය.
"බඳ තිසිරිය දද ගිත්තිය විමන් වට" - 52 පැදිය.

කවද ගිරා සන්දේශයේ මෙසේ සඳහන්ය.[32]

"සොඳ රන් රිදී දද බබලන පුරවරෙ සී" - 15 පැදිය
"විගොවන ලෙල දද සිරි සියලී යා-" 89 පැදිය.
"බඳ දද ලෙලේ පැහැරද පැසිර දස අගේ" -
"පතාක සිරසින දුරු කල දද ගල පාය" - 20 පැදිය.

මයුර සන්දේශයේ [33] මෙසේ සඳහන්ය.

"සැදි දොළී දොරේ වින් දොරේ දද අබල බර" - 6 පැදිය.
"පැහැපත් පතාක දද චත් වැනෙන වන උසා" - 7 පැදිය.

---

31. සැලළිහිණි විවරණය - මුන්දිස කුමාරතුංග vi මුද්‍රණය 1929
32. ගිරා සන්දේශය - සුගතපාල සංස්කරණය iv මුද්‍රණය 1933
33. මයුර සන්දේශ විවරණය - කුමාරතුංග මුන්දිස ii සංස්කරණය 1959

ඉහත සඳහන් කළ විවිධ පාටවලින් එකල කොඩි කුමන කාර්යයන් සඳහා බොහෝවිට භාවිත කළේද යන්න පැහැදිලි වේ. ගිරා සංදේශයේ 205 වන පද්‍යයේ මිණිතොරණ බැඳ කොඩි ගෙන සඳහන් කරයි. එහෙත්, මෙහෙත් හමුවී ඇති කොඩිවල මිණිතොරණ බැඳ තිබූ බවට සලකුණු නැත.

කොවුල් සංදේශයේ 9 පද්‍යයේ සිට 39 දක්වා පද්‍යවලින්ද තිසර සංදේශයේ 8 වන පද්‍යයෙන් හා 146 වන පද්‍යයෙන්ද ගුරුළු දද ගැන සඳහන් කරයි. ගුරුළා විෂ්ණු දෙවියන්ගේ වාහනයයි. එම සංකේතය සහිත කොඩි විෂ්ණු දේව මැදුරුවල උත්සවවලට, පෙර භාවිත කළ බව පෙනෙන අයුරු එවා අද ද භාවිත කරනු ලැබේ. මත්ස්‍ය සටහන දැරූ කොඩි ගැන සඳහන් වන්නේ තිසරයේ 42 පද්‍යයේ වැලිගම් පුර වර්ණනා කරන තැන්හිදීය. සැළලිහිණි සංදේශයේ 17 පද්‍යයේ සැවුලිඳු කොඩි ගැන සඳහන් වන්නේ, කතරගම දෙවිරදුන් ගැන වර්ණනා කරන විටය. මෙම විස්තර අනුව දෙවිවරුන් සඳහා විශේෂ සංකේත සහිත කොඩි භාවිත කළ බවද සිතාගත හැකිය.

බුදුන් දවස පැවති පුදුපුද වීදාගමින් සිය බුදුගුණ අලංකාරය කළ මහනෙත් පා මුල මාහිමියන් නමින් දවස ජයවර්ධන පුරයෙහි පැවති බුදු පෙරහැර දැක්ලාම දද, කුඩ, කොඩි ගත්තෝ යයි ලියූ බව ශ්‍රේයකය.

ලංකාව ගැන ඉතිහාස කතාවක් ලියූ ක්වේරෝස් නමැති පැවිද්දාට, පළමුවන රාජසිංහයන්ගේ කොඩිය කොළ පැහැති කලාවක් ඇති ගජ රූපයකි. 1688 දී භාවිත කළ රාජකීය කොඩිය රතු සිංහ අඩයාලම සුදු පසුබිමක සායම් කර තිබුණු බව සඳහන් වේ.[34]

1681 දී රොබට් නොක්ස් ලියූ ලංකා කතාවේ "බොහෝ (සිංහලයෝ) විවිධ රාජකීය, සාමයික උත්සව අවස්ථාවන්හිදී මග දෙපස තනා සරුවක්. එවා ඇග කොඩි නංවති," යයි සඳහන් වේ.[35]

---

34. JRAS CB Vol XI p 106

35. එදා හෙළ දිව - ඩේවිඩ් කරුණාරත්න 1962 පිට 79

පෙරහැරවලදී ද කොඩි හා සේසත් පාවිච්චි කෙරිණ. ඒවා පිරිසිදු කරනු ලදී. මඟ දෙපස කොඩි එල්ලනු ලදී.

තවද දෙවන රාජසිංහ රජ දවස ලංකාවට පැමිණි ඩාල්මාස් නම් බෙල්ජියානු වෛද්‍ය වරයා 1687 දී කොළඹ පැවැත්වුණු ආවමංගල්‍ය පෙරහැරක කොඩි ගෙන ගිය බවත් සඳහන් කරයි.[36]

තවද පැරණි පෙරහැරවල නාම වර්ණ කොඩි ගෙන ගිය බවට සාධකයක් දෙවුන්දර සිට අලුත්නුවරට ගිය පෙරහැරක විස්තරයෙන් හෙළිවේ.

"රාම දේවරද දෙවුන්දර සිට අලුත් නුවරට වඩින ගම නේ
සෑම සිව්රඟ සේනා සැදෙමින් මඟුල් දුව පෙරහැර්නි සොඳ නේ
සෝම රවි රූ ඒසව් කොඩියද පෙරමු කර ආ සෙයින් වද් නේ.
ඒ මහත් මානයක් සිවු කෝරලේ හට වන් සොඳුන් පව නේ."[37]

තවත් විස්තරයක් පහත සඳහන් පැදියෙන්ද පෙනේ.

"ඉවුල් ඔජයද පෙරමු කරමින් අසුර සෙන් බිඳ් බල වැඩී.
රවුල් දිස් හනුමන්ත කොඩියද ඒසව් ඉර සඳ ජය කොඩී.
කැමුල් සිංහය, මෝර, අලි මකරන් ද කඳුරන් ඇඳි කොඩී.
සකල් ඉද්දිකී, ඉසුරු, දෙපසින් දහස් සුවහස් රන කොඩී."[38]

ඉහතින් සඳහන් කරුණු අනුව කොඩිය විවිධ පරමාර්ථ උදෙසා පාවිච්චි කරනු ලද බව පෙනේ. මිනිස් සිතෙහි පහළවන විනෝදයෙහි, ගෞරවයෙහි, වේගවත් හැඟීමෙහි සංකේතාත්මක වර්ණ කමක් ධජයෙහි තිබූ බවද පැහැදිලිය. ලෝකයේ හැම මිනිසුන්ම පාහේ සිය සිතෙහි පහළවන ලෞකික හෝ සාමයික හෝ උද්වේගය එළිදැක්වූයේ කොඩි, ධජ, පතාකා ආදියෙන් යැයි සිතිය හැක.

---

36. The Report of the National Flag committee P. 23 (RNFC)

37. සතර කෝරළේ ලේකම් මිටියෙන්.

38. ඇඹැක්කේ පෙරහැර අලංකාරය.

එහෙත් ලංකාවේ කොයි වෙනත් රටවලදී මෙන් මානුෂ ඝාතනය මුල්කරගෙන භාවිච්චි නොකළ බව පෙනේ. කැරලිය ලංදේසිය කාරයන් කොයි කැරලි යුද්ධවලදී භාවිච්චි කළ බවට සාධක ඇත. එහෙත්, ලංකාවේ ආගමික ලංදේසි සමහර කොයි කිසි දිනක යුද්ධ සඳහා භාවිච්චි කළ බවක් සඳහන්ව නැත. මීට හේතුව වශයෙන් දැක්විය හැක්කේ අත්හාසය ගැන වෙනෙස් කරන බුදු දහම ප්‍රචාරය කිරීමට සටන මාධ්‍යයක් නොවීමයි.

## කොඩි වර්ග

කොඩි විවිධ කොටස්වලට වර්ග කොට ඇත්තේ ඒවායේ ප්‍රමාණය හා හැඩය අනුවය. මේවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. ඊ. ඩබ්: පෙරේරා මහතා ස්ව ග්‍රන්ථයෙහි සඳහන් කරයි.[39] ඒ ධ්වජ හා පතාකය. "ධ්වජය යෂ්ටියට තෝරණාකාර පත්තොත් බැඳ ඇත. පතාකය යෂ්ටිය දිගේ පහර ඇත.[40] චතුරංගනී සේනාවක ආයතනය ඇතුළු දක්නා පවා ධ්වජ හැටියට සැලකිණ. අප පරීක්ෂණයට භාජන වූ දේශ සීමාවේ පතාක හැටියට හැඳින්වූ කොඩි හමුවූයේ, සම භූමියට විවිධ වර්ණ රෙදිවලින් කළ කොඩිවැල් ලෙස සාදා තිබූ ඒවා පමණය. ඇතුරලියේ ශ්‍රී නවසාරාමයේ* විහාරගෙයි පවුරුවල චිත්‍රයක පැරණි පෙරහැරක් සායම් කොට ඇත. එහි භාරකා හා ප්‍රනාඩ හසක් විදස් යමක් සඳහන් කැන්තලක් කොඩි ඇත. මෙවැනි කොඩි හමුවන්නේ පැරණි විහාර බිත්ති වලය.

සාමාන්‍යයෙන් කොඩියේ දිග යෂ්ටියේ දිගින් අඩකි. එසේම ප්‍රමාණයෙන් විශාල කොඩි යෂ්ටියක එළවීමට වඩා ලෙහෙසි ආකාරයෙන් කඳ දෙකොනවල එල්ලා සැලීමට සකස් කළ ඒවා බවද පෙනේ.

ප්‍රමාණය අනුව කොඩි වර්ග අටකට බෙදා ඇත. එම වර්ග කිරීම ඊ. ඩබ්: පෙරේරා මහතා ශබ්ද කල්පද්‍රුමය යන ග්‍රන්ථයෙන් ගත් බව කියයි.[41] ඒ මෙසේය. ජය, විජය, භීම, චපල, වෛජයන්තික, දීර්ඝ, විශාල, ලෝල. මෙයින් ජය චතුරියන් පහක් දිගය. චතුරියනක් පළලය. අන්කොඩි අනුපිළිවෙලින් සලකා දිග පළල දක්වතොත් දිගින් චතුරියනක් හා පළලින් අඩියක් ක්‍රමයෙකට වැඩිවේ.

---

39. Sinhalese Banners and Standards - E.W. Perera P. 33.
40. Glossary to the Dampiya Commentary - Rev: Gnanissara.
41. Sinhalese Banners and Standards - E W. Perera P. 33.

* ඇතුළිස්ස මාලිඹොඩ පාරේ ඇතුළිස්සට සැතපුම් 2½ක් පමණ ඈතින් පිහිටා ඇත.

උදාහරණයක් වශයෙන් දක්වතොත් මේ අනුව විජය කොඩියේ දිග වඩු රියන් 6 යි. පළල වඩු රියන් 1 යි අඩ 1 යි. ඉහත කොඩිවල දිග හා පළල දිග ගත යුත්තේ මේ ආකාරයෙනි. මේ අනුව චාලම දිග පළල ඇති කොඩිය දිග වඩු රියන් 12 ක් හා පළල වඩු රියන් 4 ක් පමණ පළල්වූ රෙද්දකි. මෙවැනි කොඩි හරස් අතට එල්ලා තබීම නිත්‍යය පාවිච්චි කලබව සිතිය හැකිය. මේ වර්ගයට අයත් කොඩියක් සම්බන්ධයෙන් දීඝනිකායේ ශ්‍රීගම පන්සලේදී අපට හමුවිය. සත දැක්වෙන්නේ රාම රාවණ යුද්ධයයි. එ කොඩියේ එම යුදවයේ සෑම සිද්ධියක්ම විස්තරව දැක්වෙයි. මේ කොඩිය අවුරුදු 400 ක් පමණ පැරණි වෙතැයි, එම පන්සලේ නායක ස්වාමීන් ප්‍රකාශ කලහ. මේ කොඩිය ඇසල උත්සව වලදී පාවිච්චි කළ බව උන්වහන්සේ වැඩිදුරටත් පැවසූහ.

මෙම චාල කොඩි යම් සිද්ධියක් නිරූපනය කිරීම ම පරමාර්ථය කරගත් බව සිතිය හැකිය. මෙවැනි චාල කොඩි 3 ක් ඊ. ඩබ්: පෙරේරා මහතාගේ ග්‍රන්ථයේ ඇත.[42] එනම් මහනුවර කතරගම දේවාලයේ කොඩියයි.

ඉහත දැක්වූ කොඩි වර්ග අවේ වර්ණද ශබ්ද කල්පද්‍රුම යෙහි දක්වා ඇත්තේ මෙසේය.

| | | |
|---|---|---|
| ජය | - | රතු |
| විජය | - | සුදු |
| භීම | - | රෝස |
| බහල | - | කහ |
| වෛජයන්තිකා | - | පාට කීපයක් |
| දීඝ | - | කොළ |
| චාල | - | දම් |
| ලොල | - | කළු |

42. Sinhalese Banners and Standards - E. W. Perera
Plate xxv Fig: 66. 88
Plate xxxiii Fig.. 92

මෙම වර්ග කිරීමත් අප රටේ පාවිච්චි කොට ඇති කොඩි වර්ගත් ගැන සලකා බැලූ කල තවත් විෂයකට කොඩි වර්ග කොට දැක්විය හැකිය. එය මෙසේ-යි. කොඩි හා අබයාලම් කොඩි යනුවෙනි. "දුරාවේ කුලයේ කොඩිය අබයාලම් කොඩියකි." ........ මඬුලු දුර සහ තවත් දුර යන අය රකින වර්ණිවූ සිංහයකුගේ සටහනක් ඇති අබයාලම් සුදු කොඩියක්ද, තවත්දුරා අය රිලවකුගේ සටහන් ඇති කොඩියක්ද භාවිතා කළහ.[43] එහෙත් මෙකී එවැනි කොඩියක් සොයාගෙන නැත. ඒ සඳහා අපගේ වෙහෙසද නිෂ්ඵල විය.

අබයාලම් යනු සලකුණු එබී ද්‍රවිඩ ශබ්දයකි. එය එසේ නම්, අබයාලම් යනු සලකුණක් ඇත්තෝ විය යුතුය. සලකුණු ඇති කොඩියක් දී ඇත්තේ දුරාවේ වංශකයින්ට පමණක්ම නොවේ. අනික් වංශකයින්ටද සලකුණු ඇති කොඩි දී ඇති බවට සාධක බොහෝය. බත්කුල මාලාව අනුව සංකේත විස්තරයක් දැක්වේ. ඒ මෙසේය.

1. නාග කොඩිය.
2. කුකුළු "
3. මොනර "
4. කාලිංග බැඳි "
5. නැව් බැඳි "
6. හක්ගෙඩිය බැඳි "
7. සිජ්ජ "
8. කොටියා බැඳි "
9. සිංහයා බැඳි "
10. රාජාලියා බැඳි "

---

43. Monumental remains of the Dutch East India company in Ceylon.
JRASCB - 1898 vol XV - p 214

11. හංසයා බැඳි කොඩිය.
12. කම්මැරට බැඳි කොඩිය.
13. සූර්යයා බැඳි "
14. චන්ද්‍රයා බැඳි "
15. ඇතා බැඳි "
16. ගොනා බැඳි "
17. මකරයා බැඳි "
18. දැල් බැඳි "
19. මත්සයා බැඳි "
20. හනුමා "
21. ගරුඩා බැඳි "

මේ සංකේත කෞරව වංශිකයන්ගේ කොඩි ලෙස සමහරු සලකති. එසේම, මහා භාරතයේ එන කොඩි විස්තරය අනුවද කුරු-පාණ්ඩව යුද්ධයේදී මෙම සංකේත දැරූ කොඩි ~~පාවිච්~~ පාවිච් කළ බවද සඳහන්ය.

"කෞරව සේනාවීරවර ජීතුම හෙමේ කාලවර්ණ බවජය, ගඟා තල තෙත"

(භාරත ගීතය 386)

"කෞරවයන්ගේ තාරකා, චන්ද්‍ර, සූර්යයා යන සටහන් ඇති කළු සුදු පාට මදිවයා පැහැති කොඩිද, කුඩ සමූහාදියද යුද්ධ භූමියේ විසිර තිබෙන හැටි"

(ශ්‍රීපුරා, මහා භාරත කෘති එව්)

එසේම ඩී. ඩබ්. පෙරේරා මහතා "ඉහත ~~[illegible]~~ ලැයිස්තුවේ සඳහන් සියලුම සංකේත විවිධාකාරයෙන් සිංහල කොඩිවල පාවිච්චි කර තිබෙන බව" එතුමාගේ ග්‍රන්ථයේ සඳහන් කරයි. එසේම මෙම සංකේත බොහොමයක් මංගල වස්තූන් සම්මතව ඇති බවද අමතක නොකළ යුත්තකි.

රාජකීය කොඩිය හැටියට සැලකෙන සිංහ කොඩියද, අඩයාලම් කොඩියකි. මේ අතර වර්ගීය ජනයාත් වෙන්ව කොඩිද භාවිච්චි කළ බවට සාධක ඇත. එක්හම් කුමරා යුද්ධයෙන් ජයගෙන කළු හා සුදු කොඩි ~~ඇතැම්~~ දෙකෙන් කළ ධ්වජයෙන් විජයොත්සව ජයද්වජ නගාගත් බව ප්‍රචලිතය.

එමෙන් ම "පළමුවන රාජසිංහයන් කොළඹ කොටුව වටලූ දින සුවඳ සුදු හා රතු කොඩි දෙකක් දිග හැරී බවත්, ලංකා ඔය වහර දෙනු ලබන්නා හට කරුණාපූර්වක විනාශකර නන්වයකින් උද්ගත කරවන බවත් එයින් පෙන්වූ බව" කුටෝ කියයි.[44] එසේම මෙම සලකුණු යුද්ධ හමුදාවක් ගමන් ඇරඹූ බවට කළ දැනවීමක් විය හැකි බව සියම් රටේ උදාහරණය අනුව කල්පනා කළ හොත් හැකේ. එසේම රතු හා සුදු කොඩි "ජය හා විජය" යන නම් වලින් වර්ග වී තිබූ බවද මෙහිදී අමතක නොකළ යුතුය.

එසේම පොත්පතක සාධක අනුව මෙම දිවයිනේ "කළු" පරාජය ලෙසත් "සුදු" හා "රතු" ජයග්‍රහණයේ සංකේත ලෙසත් සැලකූ බව පෙනේ.

මේ අනුව කත් පට කොඩි මෙන්ම සංකේත සඳහාත් කොඩිද මෙහි භාවිච්චි කරනු ලද බව (රෝහණයේ කොඩි පරීක්ෂා කිරීමේදී) අපට සිතා ගත හැකිය. මී ලඟට අප සලකා බැලිය යුත්තේ විවිධ සංකේත කුමන අදහස් ඇති භාවිච්චි කරනු ලැබීද යන්නය.

---

44. JRASCB Vol xx p 324

කොඩිවල ඇති සංකේත

ලෝකයේ විවිධ රටවල හා ජනතාවන් කොඩි මෙන්ම විවිධ සංකේත සහිත කොඩිද භාවිච්ච කළ බවට ද සාධක ඇති බව පෙර දැක්වීමි. පොදුරාජ්‍ය මණ්ඩලයේ බොහෝ රටවල, විශේෂයෙන් ප්‍රතාපයට සම්බන්ධ කම් ඇති රටවල කොඩිවලට කිරීටය ඇතුළත් වූ බව ද පෙනේ.

වනු කැල මාලාව අනුව සංකේත විසි එකක් වූ බව ඊ. ඩබ්. පෙරේරා මහතා කියයි.[45] එසේම, ඊට පරිබාහිරව සත්ව සංකේත ද මෙරට කොඩිවල ඇතුළත් වූ බවට සාධක ඇත. මෙම රූපවල අත් හෝ කඩු හෝ දරන විවිධ සංකේත ද තිබිණි. සිංහ කොඩිය ගැන මෙහි විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

මුලින්ම ඉර හඳ සංකේතය ගනිමු. සදාකාලික බවේ සංකේත ලෙස ඉරහඳ ආදිය සිංහලයා භාවිච්ච කළ බවට සාධක සාහිත්‍ය ග්‍රන්ථවල ද සන්නස්වල ද මායිම් ගල්වලද සොයා ගත හැක.[46] මොරහැල වැල්ලව තඹ සන්නසේ ද ඉර හඳ පවතින තුරු දුන් දීමනාවක් ගැන සඳහන් වේ. ..........

"........... මැල්ලව යන ගම හැටපහමුණාන් ඇතුන්ත ගෙවතු ගත කොල කොඩවල් පටන් ඇතුළුව යන මේ නියාදේ ඉර හඳ පවතිනා තුරු නිරවුල්ව දරු මුණුබුරු වර්ග පරම්පරාවට ප්‍රවේණි සාලැස්මට කුලින් විඳිනා හැටියට ......."

සරල මණ්ඩලයක් මෙන් හා හව සඳ මෙන් ද මනුෂ්‍ය ලක්ෂණ සහිත වූහයක් මෙන්ද, ඉරහඳ නිරූපනය කොට ඇත. අටෝරාශියක් මංගල ලක්ෂණ අතරේද ඉර හඳ සලකුණු ඇත.

---

45. Sinhalese Banners and Standards - E. W. Perera P 34
46. Epigraphia Zeylanica Vol V P. 36 - Dorabāvila Pillar Inscription
Vol V part 3 Plate 47 - Aturupolayāgama "
Vol III Plate 27 Madawala Rock Inscription
Vol V part 3 Plate 59 - Weragama Sannasa.

තම තමන් පැවත එන වංශය, එනම් සූර්ය, චන්ද්‍ර, වංශ හැඳින්වීම සඳහාමද, මෙම සංකේත යොදාගත් බව පෙනේ. ශාක්‍ය වංශයේ ප්‍රධාන කොටස් දෙක සූර්ය හා චන්ද්‍ර වංශ බවද අමතක නොකළ යුතුය.

ඉර හඳ සලකුණ සඳහන් පැරණිම රාජකීය කොඩිය හැටියට දඹුලු විහාරයේ සිතුවම් කොට ඇති දුටුගැමුණු රජතුමාගේ කොඩිය දැක්විය හැකිය. එහෙත් මේ සිතුවම් කළ කාලයේ දී ඉර හඳ සංකේත පිළිබඳ උනන්දුවක් හා සැලකීමක් තිබූ හෙයින් එම සංකේත මෙහි ඇතුළත් වූවා දැයි කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය. තවත් අදහසක් අනුව රණකාමී දෙවිවරුන්ගේ සංකේත වශයෙන් හඳුන්වන ඉර හඳ එම කොඩියේ ඇතුළත් කර ඇති බවද සිතිය හැකිය.

අනෙක් රාජකීය කොඩියක ඉර හඳ සලකුණු තිබුණ බවට සඳහනක් වීම අවුරුදු 180 කට පමණ පෙර නරේන්ද්‍ර සිංහ රජු දවස භාවිතා වී යැයි සැලකෙන පැරණි සිංහල කොඩියකි ඇත.[47] මෙම කොඩියේ ඡායාවක් මාතර හාද්‍රගල* වාසෙදර ශ්‍රී සුදම්මාරාම පුරාණ පිරිවෙනේ පොත්ගුල් විහාරයේ තිබී අපට හමුවිය. එම සිංහ කොඩිය පල්ලෙ බැද්දෙ සංඝපාල රජමහා විහාරය ඇතුළු නින්දගම් පූජා කිරීමේදී ශ්‍රී රාජාධිරාජසිංහ රජතුමා විසින් කරගොට ශ්‍රී බිම්බාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට දෙන ලද්දකි.

සතර කෝරලයේ කොඩියේ ද ඉර හඳ සලකුණු ඇත. කුරුණෑගලේ විහාර කොඩිය, හනුමං කොඩිය ආදී කොඩි වලද ඉර හඳ සලකුණ ඇත.

භාරතීය රාජ්පුත් පරම්පරාව ද ඉර හා සඳ සංකේත පාවිච්චි කළේ ඔවුන් චන්ද්‍ර, සූර්ය වංශ වලින් පැවත එන හෙයිනි. එසේම ලක්දිව රජ පවුල්වල සංකේතය හැටියටද ඉර හඳ පාවිච්චි කළ බව සිතනු ලැබේ.

---

47. රෙල්ක්හවුස් මන්දිරයේ පුස්තකාලයේ ඇත.

*. මාතර - කඹුරුපිටිය පාරේ හාද්‍රගල හන්දියේ සිට සැ: 2½ කි.

"ලෝවාමහා ප්‍රාසාදයේ ඇත් දත් සිංහාසනයෙක, ඉර රුවින්ද, සඳ රුවයෙන් ද, තරු මුතුවලින්ද, සරසා තිබුණ බව කියවේ. එසේම, මේ රාජකීය දීමනා දුන් සෑම තැනම වාගේ සෙල්ලිපිවල හා සන්නස්වල සඳහන් කොට ඇත."[48] එත් සමහර සෙල්ලිපිවල බලු, කපුටු රූප කොටා ඒ පිළිබඳව විස්තර ඇතුළත් කොට ඇතත්, ඉර හඳ ගැන විස්තරයක් කොට නැත. මෙවැනි විස්තරයක් ඇතුළත් නොවන්නේ එක්කෝ මෙම සලකුණුවලින් අදහස් කළ දෙය ප්‍රකට එකක් විය යුතුය. එසේ නැත් නම් රාජකීය මුද්‍රා තැබීමට පිළිගත් එකක් විය යුතුය.

එසේම ඉර හඳ සලකුණ ඇති අතීතයේ පටම කොඩිවල වංශකතාවන් හා සම්බන්ධව පැවති බව පෙනේ. මහා භාරතයේ එන කුරු - පාණ්ඩව යුද්ධය පිළිබඳ විස්තරයෙන්ද[49] එම සංකේත ගෝත්‍රයන් හඳුන්වීම සඳහා පාවිච්චි කළ බව පෙනේ. එක් කථාවක් අනුව ඉර හඳ කොඩිය, මකර කොඩිය හා රාවණා කොඩිය මුක්කරවරුන් පරාජය කළ කොඩිව නායකයනට සිංහල රජුන් විසින් දුන් බව සඳහන්ය.

රණකාමි දෙවි වරුන්ගේ සංකේතය වූ ඉර හඳ ලක්දිව රණකාමි රජුන්ගේ කොඩියටද ඇතුළත් වූ බව එක් මතයකි. එසේම විහාර ආරාම හා ගම්ද තම පැවරීමේදී දුන් කොඩිවල හා සමහර ගෝත්‍රික කොඩිවලද මෙම සලකුණු ඇතුළත් වන හෙයින් මෙම සලකුණින් හෙළිවන්නේ තවත් අදහසකි.

රජයෙන් දුන් සන්නස් හා දීමනාවල ඉර හඳ සලකුණෙන් රාජකීය ලාංඡනය ඇඟවූ බව පිළිගැනෙන අතර "ඉර හඳ පවතිනා තුරු" යන පාඨය සඳහන් දීමනා ඇති හෙයින්ද රාජකීය කොඩි නොවන ගෝත්‍රික හා ආගමික කොඩි (පන්සල් හා දේවාලවලද) ඉර හඳ සලකුණ දක්වෙන හෙයින්ද මෙම සංකේත සදාකාලිකය යන්නක් ඇඟවීමක් කළ බව සිතිය හැකිය. පරම බලය රජතුමා අත පවතිද්දී එවැනි ප්‍රයෝග කිරීම අසාමාන්‍ය නොවේ.

---

48. The Ceylon Antiquary and Litarary register Vol VII July 1921 Part I

49. මුක්කර හටන.

ඇත්කඳ ලිහිණියාද කොඩිවල ඇති සංකේතයකි. නාම ගෙදර පඬාර ගෙන ගොස් ගල දමන, මේ ඇතුන් අල්ලන පන්නියා රාජාලි චරිතයට අයත්ය. මහනුවර යුගයේ මහ ලේකම් දෙපාර්තමේන්තුවේ කොඩියේ සලකුණද මෙයයි. මේ "මාංගහෝජ්" සත්වයාට දෙන ලද ඇත් හිස මූලික සංකල්පයේ විකාශනයක් විය හැකිය" යි ආනන්ද කේ. කුමාරස්වාමි මහතා කියයි.

මකර සංකේතය ද ලංකාවේ කෞරව වංශික කොඩිවල බෙහෙවින් ඇතුළත් වෙති. මකරගේ ලක්ෂණ රූප වල්ලියේ මෙසේ සඳහන්ව ඇති, බව ඩී. ඩබ්. පෙරේරා මහතා කියයි.

ගජේන්ද්‍ර හස්තං කාශ්‍ය පාද සිංහං
කරාල දන්තං හනුමන්ත නේත්‍රං
වරාහ කර්ණං ශාඛා මත්ස්‍ය දේහං
විචිත්‍ර පත්‍රං මකරස්ස රූපං.

මුහුදු යුද්ධයෙහි යෙදී සිටියවුන්ට කාරාවේරිය කියාත්, ව්‍යවහාර කරගෙන ආ බව කියා මානුෂජනිය[50] මුහුදේ වසන සතුන්ගෙන් ශ්‍රේෂ්ඨ සතෙකු වූ මකර නම් මත්ස්‍යයකුගේ රූපයක් සටහන් කරන ලද කොඩියක් පුරාතන සිංහල ආක්‍රමණ කාලවල සිට ඔවුනට නාවික කර්මට බලය දී තිබුණ බවද කියයි. කරෙර ආවෝ කරාවෝ යැයිද මතයක් ඇත.[51]

---

50. මානුෂජනිය - ජී. ශ්‍රී. සීලානන්ද ස්ථවිර - සමයවර්ධන මුද්‍රණාලය.
ක්‍රි: ව: 1929 - I. මුද්‍රණය - පිටු 47

51. The Religious Revolution of Lanka - Dr. H.M.G. de Silva I Edition 1961
p. 1

භාරතීය අනංගයාගේ ධ්වජයෙහි සංකේතයද මකරාය. එම දෙවියන් නමින් ගේ එක අවතාරයකදී මකරයා අධ්‍යාලම පෙරලුව ගොනගිය බව එක් දේව කතාවක සඳහන්ය.

මත්ස්‍ය සලකුණ පාණ්ඩ්‍ය රාජකීය කොඩියේද ඇතුළත් වී ඇත. එසේම මෙම සලකුණ චෝළ කොඩිවලද ඇයත්ය. විෂ්ණු අවතාරයක් වූ මත්ස්‍ය නමින් හැඳින්වෙන මනෝමය මත්ස්‍යයා මඟුල් ලකුණු 108 න් එකකි. අලංකාරය උදෙසා මත්ස්‍ය සලකුණ යෙදූ තැන් විරලයහ. සිංහල ධජවල ජලයේ සංකේත හැටියට මත්ස්‍ය හා තනත රේඛා යොදා ඇත් බවද පෙනේ. මත්ස්‍ය සලකුණ අනංග ධජයෙහිද සලකුණයි. කාමයත් මත්ස්‍යයාත් එකට සඳහන් වන්නකි. කාමය පිළිබඳ දෙවියන්ගේ කොඩියේද මත්ස්‍ය සලකුණ යොදා ගැනීම වැදගත් කරුණකි.

හංසයාද සිංහල කොඩිවල සංකේතයකි. චන්ද්‍ර අංගයේ හැටියට මේ සතා ඇදුව පක්ෂියාය. දියමුසු කරන ලද කිරි වතුරෙන් දිය වෙන්කොට ගත හැකි දක්‍ෂ කමක් ඇත මේ පක්ෂියා විවේචන ඥානය සඳහා චන්ද්‍ර අංගයෙන් දැක්වේ. ලීලා සම්පන්න සත්මන සඳහාද මේ නම යෙදෙයි.

බත්කුල මාලාවේ සංකේත 21 ක් දක්වා ඇතත්, ඒ හැම සංකේතයකම සඳහන් කොඩි සොයා ගැනීම අපහසුය. මේවායින් මොනර, කොටියා, සිංහයා මකරා හනුමා සහ ඇතා බැඳි කොඩි අතුරෙන් සමහරක් ඇදුනු රෝහණයේ දේවාලවල හා තවත් සමහරක් පුද්ගල සන්තකවද තිබෙන බවත් පෙනේ.

හනුමා බැඳි කොඩිය තාවන්දන්නා කාලයේ කොඩි හැටියට දක්වා ඇත. මෙයින් වැඩිකම් නිරූපනය කෙරෙනැයි ඊ. ඩබ්. පෙරේරා මහතා කියයි.[52]

---

52. Sinhalese Banners and standards - E. W. Perera P 22

ලක්දිව අන් ප්‍රදේශවල මෙන්ම විශේෂයෙන් මාතර කොඩියේ සංකේතය ලෙස ඇතා දැනට වැදගත් සළකුණක් ගනී. වැලන්මයන් කියා හැටියට මාතර දිසාවේ ඇත්තේ කුඩා ඇතුන් දෙදෙනෙකු සටන් කළ කොඩියකි. "ගම්පල කෝට්ටේ රාජධානි සමයන්හි මෙන්ම පෘතුගීසි හා ඕලන්ද රාජ සමයන්හිද ගජනායක නිලමේගේ මූලස්ථානය මාතර පිහිටියේය. මේ කාරණාත් සමඟ රුහුණු ප්‍රදේශය ප්‍රසිද්ධව ඇත්තේ කුඩා ඇලින්" රුහුණු ගැටව්" යන නිසාත් මෙම කොඩියේ කුඩා ඇතුන් දෙදෙනෙකු ඇතුලත් වූ බව සිතිය හැකිය.

[illegible] ලංකාවේ සඳහන් සංකේත බොහොමයක් ඇතුලත් විවිධ කොඩි ලංකාවේ භාවිච්චි කළ බව ඇම්බැක්කේ පෙරහැර අලංකාරයෝ ගත් පහත සඳහන් පද්‍යයෙන් පෙනේ.

" තුවුල් වරයද පෙරමු කරමින් අසුර සෝන් වද් බල වැඩි
රවුල් දිස හනුමන්ත කොඩියද පිහිටි ගුරුළද ජය කොඩි
කවුල් සිංහය - මෝර - අලි මකරුන්ද කඳුරත් ඇඳි කොඩි.
සකල් මුද්‍රික් සසුන් දෙවයන් ද හස් සුවහස් රජ කොඩි. "

මෙසේ දැක්වූ කාරණා අනුව පැරණි අඩයාලම් කොඩිවල බොහෝවිට භාවිච්චි කර ඇත්තේ මංගල වස්තු බවද පැහැදිලිව පෙනෙන කරුණකි.

## සිංහ සංකේතය

මෙම සංකේත අතරෙන් විශේෂයෙන් සඳහන් කළ යුත්තක් සිංහයා. සිංහලයන්ගේ මිනිසුං කවි ගත ආදී පුරාණයන්ද පැවසුව කළ සංකේතය සිංහයාය. "බුදුන් වහන්සේගේ ශාක්‍ය සිංහයන් නාමය සහ රාජසිංහ යන රාජකීය නාමය මෙන්, බල උත්කෘෂ්ට භාවය හා තේජස සඳහා යෙදේ. කේතු ලාංඡන හෝ දෙකක් ගණයකට අයත් සිංහලයෝ සිංහල කලා වේදීන් විසින් ප්‍රමුඛත්වය ලබන.[53]

නරසිංහ හා ගජසිංහ සිංහයන් මෙන් රූපාවලිය ගණන් නොගත්. මුව යන වචනය සිංහලයේ හැම සංයුක්තවම යොදුම යෙදිණ. එසේ මුවාටම විශේෂයෙන් යෙදිණ. මේ නිසා රාජකීය කොඩිය සිංහරාජ කොඩිය හෝ හොත් සිංහයා කොඩිය නමින් හැඳින්වේ. මේ මතය උඩ පිහිටා "ඒ. ඩබ්. කැප්පෙටිපොල මහතා මුව සලකුණ දරණ කොඩි සිංහ කොඩියේම විචලත්වය හෙළි කරන බව කියයි."[54]

රූපාවලිය සිංහයන් පිළිබඳ පහත සඳහන් විස්තරය දෙයි. "කේසර, හරිත, කාසුක්‍ය, වරාහ, සිංහ, මරින්, මාතංග, ශිබි, කාන්තාර, ගන්ධර්ව, ගල්ලකා මකර, කුංජර, කාබා, මාග, වීරසිංහ මොවුහු සොළොස් ගණයකට අයත් සිංහයෝය.

"කෘෂ්ණ, කාල, පාණ්ඩු, කේසර, යන නියම සිංහයන් හතර දෙනාගෙන් කේසරී අති ශ්‍රේෂ්ඨය." කොඩිවල දක්වෙන සිංහයා කොටබු මකොත්දුය රූපාවලිය විස්තරයෙන් පෙනේ.

සිංහයා නාවකුගේ ඇසේ බඳු ඇසද, වයසාරු පොජුවක්ද, සන්ධු ලොම්ද, පපුවේ හා උරහිසට යමින් දික් ලොම්ද, බැවලවකුගේ බඳු කර පිරුණු පිටක්ද, ලෙයෙන් පිරුණු අයකුගේ බඳු සිරුරක්ද, ප්‍රභාවත් නමින් විලාසයක්ද, දික් වලගක්ද තිබේ.

---

53. මධ්‍ය කාලීන සිංහල කලා. ආනන්ද කේ. කුමාරස්වාමි. පිට - 84

54. Sinhalese Banners and Standards E. W. Perera p. 19.

සිංහ සංකේතය සිංහලයා සෑම කාරණාකදීම බෙහෙවින් භාවිත කොට ඇත. මිහිපිට වසන සිව්පාවුන්ගෙන් බලවත්ම සතා සිංහයා හැටියට සැලකුණු නිසාත්. සිංහයාගෙන් හෝ සිංහ නමැත්තාගෙන් පැවත එන්නේ යැයි සලකන සිංහලයා එම සංකේතය බහුල වශයෙන් භාවිත කිරීම සාධාරණය.

"සිංහයා, සිංහල කලාවේ බහුල වශයෙන් යෙදෙන මෝස්තරයක් වීම පුදුමයක් නොවේ. හැටිට සිටින සිංහයාගේ මේ ගුරුයචිව ඇතැම්විට යුරෝපීය බලපෑම නිසා සිදුවිය හැක. ලිංග සුරතින් කැටුවක් ගෙන සිටින විට මේ බලපෑම සාකල්‍යයෙන්-ම ප්‍රකාශනය. ....." බෙල් වැසන් (කෑගලු වාර්තාවේ 12 වැනි පිටුවේ) නිරූපිත ගුරුසඳ මහ කොඩිය සම්බන්ධයෙන්ද මෙය සාධාරණය. මෙවැනි ධජවලද බලපෑම පැහැදිලි ලෙස පෙනේ. දෙවැන්න සඳහන් කොඩිය සාදන ලද්දේ යාපනේදී විය හැකිය. හැටිට සිටින සිංහයෙක් සහිත ධජවලද කාලවල හොඳ භාවිතය මේ අනුකරණයට හේතුව විය හැකිය."[55]

කලාකරුවාට කලාවේ ස්වභාවයෙන්ම අයත්ව ඇති නිදහස සිංහ සංකේතය නිරූපනය කිරීමේදීද භාවිත කළ බව පෙනේ. කලාශිල්පියාට තාත්විකත්වයට නැඹුරු වීමේ හැම විටම අවශ්‍ය නොවේ. ඔහුගේ හොඳ පරමාර්ථය භාව ප්‍රකාශනය කිරීම නිවැරදි යයි සිතීම. ආනන්ද කුමාරස්වාමි මහතා කියන හැටියට වැපලිගාර චිත්‍රයෙහි සිංහයන් වැනි අඩම අපෙඳුරු තාත්විකත්වයෙන් පෙර දිග කලාව ඈත්වූයේ මේ නිසාය.

ඉහත දැක්වූ කරුණු අනුව චිත්‍ර ශිල්පියාගේ සිංහයා මිහිපිට වසන සිංහයකු හා සමාන වීම අනවශ්‍යය. හෙතෙම ප්‍රකෘති විද්‍යාව පිළිබඳ ග්‍රන්ථයක් නිරූපනය කරන්නකු නොවන නිසා විය යුතුය, සංකේතය චිත්‍ර වෙස් ගන්නේ. එසේම නම ජාතක පැවැත්ම පිළිබඳ සම්පූර්ණ සිද්ධාන්තයක්, කල පෞද්ගලිකත්වයේ හා ජාතික විශේෂත්වයේ ශක්තියක්. මේ මාර්ගයෙන් ප්‍රකාශ කිරීම ඔහු සතු කාර්යය යයි කුමාරස්වාමි මහතා සිය ග්‍රන්ථයේ සඳහන් කරයි.[56]

---

55. මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කේ. කුමාරස්වාමි 85 පිට
56 " " " " - " " " 86 පිට.

ජාතක ශිල්ප සම්ප්‍රදාය සම්බන්ධයෙන් විස්තර කොට ගත් සිංහයාගේ ප්‍රභේද, සොළොසක් සිංහල ශිල්පීහු දුටහ. කේසර සිංහයා මින් උතුම්ය. සිංහල ශිල්ප සම්ප්‍රදායය වස්තු කරගන්නා ලද්දේ මේ ශ්‍රේෂ්ඨ සිංහයාය.

ජාතක ශිල්ප සම්ප්‍රදායට සිංහයා විස්තර කොට ගත් ආදිම සලකුණ දක්නා ලැබෙන්නේ, ක්‍රිස්තු වර්ෂයට පෙර තුන්වන සියවසේ කෝසල රාජ්‍යයන්ගේ තනවන ලද සාංචි ස්තූපයේ නැගෙනහිර දොරටුවෙහි වූ කැටයමකිනි. බුද්ධයානු කැටයම් ශිල්පයේ උසස්ම නිර්මාණයක් හැටියට සලකන මේ දොරටුවෙහි සිංහ පරපුර වංශයන් හා මෞර්ය රාජ්‍යයද අතර පුරාණයේ පැවති උසස් මිත්‍ර සම්බන්ධය දක්වෙන කැටයම් කිහිපයක්ම දක්නා ලැබේ. මේ දොරටුවේ පහළම හරස් බාල්කයෙහි මැද භාගයෙහි කැටයමක බෝධිවෘක්ෂයක් භාජනය පවත්වන පෙරහැරක් පෙන්වයි. සමහරවිට බුද්ධගයාවේ බෝධි වෘක්ෂ භාජන හමුවේ පවත්වන ලද ඒ පෙරහැර මහින්ද හිමියන් වහන්සේ ලංකාවට වැඩම වීම දක්වන අවස්ථාව නිර්මාණ කොට කැටයම් කරන ලද්දක් යැ"යි සිතිය හැක. ඒ අතර සහ දෙපස්තම්භයෙහි වූ කැටයම් වල දේශාන්ත ජනසමූහ රජකුමා හා මෞර්ය වංශික අනේක රජකුමාරයන්ගේ රාජකීය කොඩිවල සටහන් වූ සිංහ සහ මොණර රූප කොට ඇත. මධ්‍යම බාල්කයෙහි මැද කොටසෙහි බෝ පැලයක කැටයමක් දක්නා ලැබේ. සමහර විට එය අනුරාධපුරයෙහි [illegible] රෝපනය කළ බෝ පැලය විය හැකිය. ඒ වටාද පෙරහැරක් ගමන් කරන ලීලාව දක්වා තිබේ. තවද, ඒ දෙපස කැටයම් වල සිංහ රූපද, සිංහ පරපුරේ රජකුමාරයාගේ ආයුධ සටහන්ද, ඇත් රූපද දක්නා ලැබේ. මොණර රූපය මෙහි නැත.

---

ක්‍රි: පූ: 3 සියවසේ කරන ලද මහා විහාරය සිංහයකුගේ හැඩහුරු කම අනුව තනන ලද බව වංශ කතා කියයි. සීගිරියට එම නම ලැබුණේ සිංහ ආකාරය සැලැස්ම ලෙසගත් නිසා යයි ප්‍රචලිතය. පොළොන්නරු කර්මාන්තවලද සිංහ රූපය බෙහෙවින් දක්නට ලැබේ. මෑත යුගයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ රන්කාසිවල ද ඊට මෑත විජය කෝට්ටේ රජවරුන්ගේ මුද්‍රාවෙහි ප්‍රධාන සටහන හැටියටද මේ සිංහ රූපය දක්නට ලැබේ.

සිංහ කොඩිය යටතේ රණකාමී සිංහල හමුදා ගමන් කළ බව කියන දක්ෂිණාත්‍ය සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල පමණක් නොව දෙමළ සාහිත්‍ය ග්‍රන්ථවලද සඳහන්ය.

එළාර රජුට විරුද්ධව සටන් කළ ගැමුණු රජතුමාගේ සිංහ කොඩිය පිළිබඳ කරන ලද සිතුවමක් දඹුලු විහාරයේ ඇත. පැරකුම්බා සිරිතේ සිංහ කොඩිය ගැන වර්ණනාවක් " දක හිම සෙලි දුනු සිහ දද උතුරු දෙස" යන පාදයෙන් හෙළි-දරවයි. උත්තල්බොඩ සන්දේශය අනුව, උසස් ආදරෙන් සේවය කළ පුත්‍රවරයකුට සිංහ කොඩිය පාවිච්චි කිරීමේ අයිතිය පැවරූ බව පෙනේ.

16 වන සියවසේ පෘතුගීසි ආගමනයෙන් පසු මෙම ජාතික කොඩිය යුරෝපීයන්ගේ කොඩි පිළිබඳ සම්ප්‍රදායන්ට අනුව සකස් කරන ලදී. සමහර කොඩිවලට කුරුස ලාංඡනයද ඇතුළත් විය. කඩුව වෙනුවට සිංහයා දකුණු අතින් ගෙන ඇත්තේ කුරුසයකි.

සිංහ සටහන යෙදූ කොඩියක් සහිතව පුවක් පටවූ නැවක් පුත්තලමට යාත්‍රා කිරීමට සැරසීමේ පුවතක් ගැන 1688 වර්ෂය පිළිබඳව ලියූ බෙකානෝප්ප්ර්ගේ ඉතිහාසය කියයි.

---

57. JRASCB VOL XI NO 38. pp 106, 109

II රාජසිංහගේ අවමංගල්‍ය උත්සවය ආරම්භ කොට ඕලන්දයන් විසින් කොළඹ පැවැත්වූ ප්‍රෞඪ පෙළපාළියක් ගැන බැල්ඩියස් නමැති මෙවිතුවරයකුගේ සටහන අනුව "........"....... ඊට පසු බෙර වයන්නන් සිව්දෙනෙක්ද, ඊට ඉක්බිතිව දුනුලී කාරයෙක්ද අතින් එය නැමී ගමන් කළහ. රන්වන් කොඩියක සිංහ රූප සිංහයකුගේ සටහන ඇති මහනුවර රජතුමාගේ ධජයද අවරදිම ඇදගෙන ගෙන යන ලද්දේය." [58]

සිංහල රාජධානිය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්වූ අවස්ථාවේදී එහා හෙලන ලද කොඩිය විශාල දත්කටු පාදයෙන් කඩුව ගත් සිංහ රූපය යෙදූ කොඩියකි. දිගින් රියන් 10ක් හා පළලින් රියන් 5ක් පමණවූ මේ කොඩිය සවිකරන ලද යෂ්ටිය මුදුනේ සවරන් බැඳි පොහොට්ටුවක් විය. මේ නිසා සිංහලයට අයත් කොඩිය බව සමහරු සිතති. ඊ. ඩබ්. පෙරේරා මහතා විසින් චෙල්සි ආරෝග්‍ය ශාලාවේ තිබී සොයාගන්නා ලද්දේ මෙම කොඩියයි සිතිය හැකිය.

කොඩියේ ඇතුළු යම් යම් ශබ්ද, විවිධ සංකේත වශයෙන් දක්වාන්නාක් මෙන් සිංහ සංකේතය මෙන්ම කවර සංකේතයක් වුව යම් වස්තුවක් හෝ අදහසක් හෝ නිරූපනය කරන බව පැහැදිලිය.

සෑම ජාතියකගේම පොදු සංකේතය ඔවුන්ගේ ජාතික කොඩියයි. එයින් "තමන්ගේ රට" කුමක්ද යන්න දක්වයි. වර්ණ මෙන්ම සතුන්ගේ රූපද ලෝකයේ සංකේත වශයෙන් යොදා ඇත්තේ ආදියේ පටන්මය. සූඩානයේ කාර්දනයන්ගේ කම්මුල කපා දක්වනු ලැබූ සලකුණු වලින් ඔවුන්ගේ ගෝත්‍රය හඳුනා ගත හැකිය. (W. B. E. 763)

---

58. Sinhalese Banners and Standards E. W. Perera. P. 8.

අප රටේ උසස් ගෞරව නාමය වන සිංහ කොඩියේද ප්‍රභේද දැක්විය හැකිය. සිංහයා වෛෂීය සංකේතය කොටගත් බව සාමාන්‍ය මතයයි. බොහෝ සිංහලයා සිංහ සංකේතයම ජාතිත්වයට ගැනීමත් එය නොවෙනස්ව අද දක්වා පවත්වා ගැනීමත් විමසිය යුතු කරුණක් යැයි සිතමි.

සිංහලයන් බෞද්ධයන් වන හෙයින්, බුදුරජාණන් වහන්සේට අසීමිත ගෞරවයක් හා භක්තියක් දක්වා ජීවත් වෙති. එසේම, උන් වහන්සේගේ ධර්මය ගැන පමණක් නොව බුදු යන වචනයටද තමන් ගරුද යොදා නම් තැබීම එසේ කළ බවට ඉතිහාසය දෙස් දෙයි. බුදුරජාණන් වහන්සේ හඳුන්වා ඇත්තේද ශාක්‍ය සිංහ යන විරුද නාමයෙනි. ධර්මාශෝක රජතුමා සිංහ සංකේතය කලා ශිල්පවල යොදා ඇත අතර ශාක්‍ය වංශය ඇතුළුවමද, මෙලෙස කළ බව පෙනේ. ශාක්‍ය වංශයත්, බුදුරජාණන් වහන්සේත්, අපේ සිංහල පරපුරත් අතර කළ, පූජනීයත්වයට පත්කළ කරුණු දෙකක් බව නොකිව මනාය. මේ අනුව බෞද්ධාගමටත් එය ලොවට ඉගැන්වූ උන්වහන්සේටත් ගරු කරනු සඳහා සිංහ සංකේතය නම රාජකීය කොඩියට ඇතුළත් කරන ලද බව සිතිය හැකිය. එසේම, තවත් මතයක් අනුව බුර හද ශාක්‍ය වරුන්ගේ කොටස් දෙකක් වූ සූර්ය හා චන්ද්‍ර වංශ සංකේතාත්මකව නිරූපනය කළේයයි කියවේ. මේ අනුව සිංහයකුගෙන් ඇතිවූයේ, සිංහලයන්ගේ ප්‍රභවය පිළිබඳ සංකේතයට එක් බෞද්ධ ස්වරූපයක්ද සිතිය හැකිය.

ඊළඟට අප සලකා බැලිය යුත්තේ එවට කොඩිවල ලදී සිංහයා දක්වා ඇති සංකේත හා එයින් අදහස් කළේ කුමක්ද යන්න ගැනය. මෙම සංකේත අතර කඩුව, කසය, බෝඅත්ත, අන්නාසි ගෙඩිය, ගැන විශේෂ අවධානය යොමු වන්නේ රජවරුන්ගේ කොඩි අතර ඇති සිංහ කොඩි අතරද මෙම සංකේත පෙනෙන හෙයිනි.

---

ලංකාවේ හමුවී ඇති රාජකීය කොඩි හැම එකකම ඇත්තේ කඩුව දකුණු අතින් දරා සිංහ සංකේතයකි. රාජකීය භාණ්ඩ අතුරෙන් කඩුවද පළමු තැනට භාණ්ඩවලින් එකකි. එය රාජත්වය අඟවන සලකුණ හැටියට මුල සිටම පාවිච්චි කරන ලදී.

සොලොස්වන සියවසේදී ජාතික කොඩියේ ඇතුළත්වූයේ සිංහ සංකේ-තයකි. මේ බව පැරකුම්බා සිරිතේ 91 පැදියේ මෙසේ දක්වා තිබේ.

"දක හිම සෙලේ තුන් සිහ දද උතුරු දෙස"

මල්වත්ත විහාරයේ තිබූ පුස්කොළයක ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩියේ සිංහ ලාංඡනයක් වූ බව කියයි. පෘතුගීසි රේඛාවල ප්‍රකාශකයෙකු ජයවර්ධන පුර කෝට්ටේ කෙරුවූ උස සිංහ ලාංඡනය දක පුදුම වූබව කියයි.[59] එසේම දහතර වන සියවසේ සිටම සිංහ ලාංඡනය මෙන්ම සිංහ කොඩිය කෝට්ටේ රාජධානියේ භාවිත වූ බව පෙන්වා දිය හැකිය. කොඩ්රින්ටන් මහතාගේ හා ගරු ඇස්. ජී. පෙරේරා පියතුමාගේ පර්යේෂණ නිසා කෝට්ටේ යුගයේ කාසි බොහොමයක සිංහ ලාංඡනය යොදා ඇති බව හෙළිවී ඇත. මෙම කාසි කොළඹ කෞතුකාගාරයේ තිබේ.

7 වන බුවනෙකබාහු හා දොන් ජුවන් ධර්මපාලයන රජවරුන් ගේ මෙහෙකාසක ලිපි ලේඛන මුද්‍රා තබා ඇත්තේ සිංහ ලාංඡනය සහිත මුද්‍රාවක් හැ'ය දොස්තර පෝල් ඊ. පීරිස්, ගරු ඇස්. ජී. පෙරේරා පියතුමා හා අතිගරු එඩ්මන් පීරිස් පියතුමාද ලිස්බන්හිදී හා රෝමයේ වතිකානුවේ දී දුටු බව කියැවේ.[60]

මෙහි දක්වූ විස්තරය අනුව කඩුව අතින් ගත් සිංහයා රාජකීය කොඩිය හැටියට පාවිච්චි කළ බව සිතිය හැකිය. දැනුදු රාජකීය සම්මාන සඳහා කඩුව පෙරටු කොට ගමන් ගැන්මද පවත්නා බව අමතක නොකළ යුතු කරුණකි.

---

59. Report of the National Flag Committee P. 22

60. " " " " " P. 23

දිසා කොඩි.

රාජකීය කොඩිය හැරුණු විට තවත් විවිධ කාර්යයන් උදෙසා කොඩි බෙදුන් බවට පැහැදිලි සාධකයක් දීනට හමුවී ඇත. දිසා කොඩි. පරාක්‍රමබාහු රජු ලංකාව පුරාම දේශ සීමා වෙන්කොට ග්‍රාම සීමා නිශ්චය කළ බවට සාක්ෂි ඇත. දහහතර වැනි සියවසේදී ලියන ලද කාව්‍යයන් පොත්වලින්ද මෙම සීමා ගැන අදහස් ලබා ගත හැකිය.

තම රාජ්‍යය කුඩා දේශ සීමාවකට සීමා වූ විට ප්‍රදේශවලට බෙදීම අනවශ්‍යය. රජුගේ සීමාව විශාල වන විට පාලන පහසුකම් සඳහා ( විශේෂයෙන් ගමනා ගමන ක්‍රම නොදියුණු අවධියක ) රට කොටස්වලට බෙදිය යුතුය. ලක්දිව එක්සත් කළ හැම රජෙකුමම මේ ප්‍රශ්නයට මුහුණපාන්ට සිදුවූ බව ඉතිහාසයෙන් පෙනේ.

දීනට සොයාගෙන ඇති ප්‍රාදේශීය කොඩි හයවැනි පරාක්‍රමබාහු රජ (1412-1467) ලක එක්සත් කළ පසු ප්‍රදේශවලට දුන් ඒවා හැටියට සැලකේ. 1551 දී දොන් ජුවන් ධර්මපාල ලංකාව රාජධානි හතරකට හා දිසා හතරකට හා බෙදූ බව ලංකා ඉතිහාසය අනුව පෙනේ.

පහත රට ප්‍රදේශ පළමුව පරංගීනටත්, දෙවනුව ඕලන්දයනටත් අයත් වූ පසු උඩරට ප්‍රදේශ මහනුවර රජු විසින් ප්‍රතිසංවිධානය කරන ලදී. මේ නිසා කුඩා ප්‍රදේශ රාජ්‍යයන් වැඩිවූවා පමණක් නොව එම ප්‍රදේශවලටද කොඩි ප්‍රදානය කළ බව පෙනේ.

ඉන් සමහර ප්‍රදේශ මෙහි සඳහන් නොවන්නේ ඒවා අප පරීක්ෂණයට අයත්වන දේශ සීමාවෙන් පිටත පිහිටා ඇති නිසාය. මහනුවර රජුන් කාල සිංහල රාජ්‍යය සතර කෝරළය, සත් කෝරළය, ඌව මාතලේ, සබරගමුව, තුන් කෝරළය වලපනේ, වියළුව, උඩපළාත, නුවර කලාවිය, වෙල්ලස්ස, බින්තැන්න, තමන්කඩුව යන මහ දිසා දොළහකට බෙදී ඇල්වෙල්ලන්, ඉර හඳ, සිංහයා, සුදු, කාහපටරේද, හේරුඇඹ පක්ෂියා, මයුර, නෙළුම්මල්, ගජසිංහ, කොටියා, ගිරවා, වලහා යන කොඩි පරිහරණය කර දිසාපතිවරු දොළොස් දෙනෙකුද පත්කර සිටියෝය. රාජකීය උත්සව දිනවල හා දළදා පෙරහැර ආදී ආගමික උත්සව දින වලදී දිසාපතිවරු මේ කොඩි පෙරටු කොටගෙන සිය සෙන් පිරිවරා මහනුවරට පැමිණේ.

ඒ ඒ දිසාවන් වලින් පැමිණි පිරිස හඳුනාගන්නේ කොඩිවල අනුසාරයෙනි.[61] ඊ. ඩබ්. පෙරේරා මහතාගේ පොතේ[62] දක්වන දිසා කොඩි (අප දේශ සීමාවේ) පහත සඳහන් වේ.

ඌව - i හංසයා මහ කොඩිය.

ii තොළම්මල් මහ කොඩිය.

සබරගමුව - සාහපවරෙද් මහ කොඩිය - දැලි කොඩිය - රන් මහපට කොඩිය, රාවණා කොඩිය.

සත් කෝරළේ - සේරුඩ පක්ෂියා මහ කොඩිය.

වලපනේ - මයුර මහ කොඩිය

වෙල්ලස්ස - කොටියා මහ කොඩිය.

බින්තැන්න - ශරබා මහ කොඩිය.

තමන්කඩුව - වලහා මහ කොඩිය.

හතර කෝරළේ - ඉර හඳ මහ කොඩිය.

මාතර - සැබෑ ඇඳහකු සමහන් කළ ඇත් කොඩිය.

මාතර සමුපකාර රෝහලේ විත්තියේ ඇඳ තිබෙන කොඩි (පැරණි ඉලංගක්කෝන් වලව්ව) අතර දිසා කීපයක කොඩිද දක්වේ.

1. ඌව හා වලපනේ දිසාව - මොණර සුදු කොඩිය
2. සබරගමු දිසාවේ - රතුපාට කොඩිය.
3. කෝරළ සතේ දිසාවේ - සේරුඩ පක්ෂියා සුදු කොඩිය.

මාතර කතුරුපිටියේ විල්ලේගොඩ විහාරස්ථානයේ පරම්පරාව දක්වෙන පුස්කොළ ලිපියක[63] දිසා කොඩි සමහරක් සඳහන් වේ.

---

61. සබරගමුවේ පැරණි ලියවිලි - කිරිඇල්ලේ ඥානවිමල ස්ථවිර (i මුද්‍රණය පිට XXV ii)
62. Sinhalese Banners and Standards. E. W. Perera - P. 10 - 14
63. කතුරුපිටියේ විහාරස්ථ නායක හාමුදුරුවන්ගෙන් ලැබිණ. පරිලාලි පිටපත - ඊස්ගොඩ

1. ඌව පළාත දිසාවේ නෙළුම් කොඩිය.
2. කෝරල තුනේ දිසාවේ ගෝරුකාඩ පක්ෂියා කොඩිය.
3. මාතලේ දිසාවේ සුදු කොඩිය.
4. හතර කෝරලේ දිසාවේ සිංහ කොඩිය.
5. සබරගමු දිසාවේ සිංහ කොඩිය.
6. ඌව හා වලපනේ දිසාවේ මොණර කොඩිය.
7. හතර කෝරලේ දිසාවේ හිරු හඳ කොඩිය.

කොළඹ මල්ලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙනේ බණ ශාලාවේ සීලිමේ මෑතකදී ඇඳ ඇති කොඩි අතරද දිසා කොඩි කීපයක් දක්වේ.

1. රත්නපුර දිසාවේ කොඩිය.

 මෙම කොඩියේ සිංහයා වම් අතේ කඩුවක් ගෙන ඇත.

2. තමන්කඩුව දිසාවේ කොඩිය.

 වම් අතින් අසිපත් ගෙන සිටින සිංහයෙකි. කොඩියේ හතර කොනේ තරු හතරකි.

3. හතර කෝරලේ දිසා කොඩිය.

 මැද සිංහ රූපයකි. මුලු හතරේ බෝපත් හතර ගැන්ව සලකුණු සතරෙකි.

4. හම්බන්තොට දිසා කොඩිය

 මෙහි මොණරකු සටහන් කොට ඇත. මල් සහිත මල් අත්තක් කටින් වැහැගෙන සිටී.

5. මාතර දිසාවේ කොඩිය.

 මැද ඇත් රූපයකි. ඒ වටා නෙළුම්මල් අටෙකි. මුලු හතරේ මල් හතරෙකි.
 කොඩියේ අග ත්‍රිකෝණාකාරව එල්ල රෑස සුදුපාට තීරු දෙකකි.

6. වෙල්ලස්ස දිසා කොඩිය.

 සිංහයා කටින් මල් වැලක් දරයි. මුලු හතරේ මල් හතරකි.

7. හතර කෝරලේ කොඩිය (දෙවැන්න)

 හිරු හඳ කොඩිය (මෙහි තරු 32 ක්ද ඇත.)

ඉහත සඳහන් තැන්වල දක්වෙන කොඩි අතුරෙන් පෙළවන තොරතුරු කීපයකි. එක් එක් යුගවලදී දිසාවලට වෙන වෙන කොඩි දුන් බව මින් පැහැදිලිවන්නේය. මෙය එක් එක් රජවරුන්ගේ රාජ්‍ය සමයන්හිදී විය හැක්කේය.

එකම දිසාවකට කොඩි කීපයක් ලැබුණු බවද පෙනේ. උදාහරණ වශයෙන් කාසපරෙද් මහ කොඩිය, දැල් කොඩිය, රත්මහපට කොඩිය, රාවණා කොඩිය, සබරගමුවට දුන් බව සඳහන් කළ හැකිය. ගුරුහඳ මහ කොඩිය හා සිංහ කොඩිය යන විසින් සතර කෝරළයට කොඩි දෙකක් දුන් බව සඳහන් කළ හැකිය. මාතර දිසාවේ දුන් භාවිතා කරන කොඩියේ ඇඳි රූප දෙකකි. කලින් ලැබුණු කොඩියේ ඇඳි රූප එකකි.

ඉහත සඳහන් නිදසුන් අනුසාරෙන් රජවරුන්ගේ කැමැත්ත අනුව එකම දිසාවට කොඩි කීපයක් දුන් බවත් එවායේ සංඛ්‍යා පවා වෙනස් වූ බවත් පැහැදිලි වේ.

තවද දිසා සම්බන්ධයෙන් සපිර වශයෙන්ම දුන් කොඩි වලට "මහ" යන උප පදයක් දී ඇති බව පෙනී යයි. ඊ. ඩබ්. පෙරේරා මහතාගේ පොතේ 10-14 වැනි පිටුවල මෙම දිසා කොඩි ලැයිස්තුව එයි. මාතර දිසාව හැරුණු විට අන් හැම දිසා කොඩියක්ම ගැන සඳහන් වන විට "මහ" යන උප පදය යොදා ඇත.

මාතර කතුරුපිටියේ වෙල්ගොඩ විහාරස්ථානයේ පරම්පරාව දක්වෙන පුස්කොළ ලිපියේ (ඉහත සඳහන්ව ඇත.) දිසා කොඩි හැටියට සිංහ කොඩිය දී ඇති බවද සඳහන් වේ. මෙසේ රාජකීය කොඩිය හැටියට භාවිත කළ සිංහ කොඩිය දිසා කොඩියක් ලෙස දීමට හේතුවූ කරුණු කිමෙක්දැයි පැහැදිලි කළ යුත්තකි. ඉහත සඳහන් කළ පුස්කොළ ලිපියේ අනුයොදු ඇති පාඨය අනුව මෙම කොඩි විහාර පරම්පරාවල බුදුබල පූජාව පැවැත්වීම පිණිස රාජාධිරාජසිංහ රජු විසින් දුන් බව පෙනේ. පන්සල් වලට තවත් සිංහ කොඩි දී ඇති බවට ඇම්බැක්ක නරසිංහ කොඩිය, සිංහ කොඩිය මහනුවර හා මාතර වටගෙදර පන්සලේ සිංහ කොඩිය සාධක හැටියට දැක්විය හැකිය.

---

එසේම සිංහ සංකේතය මෙන්ම රාජ සංකේතය ලෙස සැලකුවද මේ කොඩි විශේෂ පුද්ගලික වරප්‍රසාද දීමේදී රජතුමා විසින් පුද්ගලයන්ට පවරා දුන් බව පෙනේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඇමතිගේ රාජකීය කෝන්කයාට (බමන් ගෙදර රාලට) රාජකීය ලාංඡන සමඟ කොඩි දුන් බව ඊ. ඩබ්. පෙරේරා මහතා සිය ග්‍රන්ථයේ[64] සංදේශනයේ සඳහන් කරයි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ඌවට දුන් හංස කොඩිය අංගම්මන දිසාවට දුන් බවද සඳහන්[65] වේ. මේ දැනට මහනුවර මල්වත්ත විහාරයේ ඇත.

මෙම දිසා කොඩි හැරුණුවට සමහර විට පුද්ගලයනට (දිසාවට) දුන් කොඩිද භාවිතා කළ බව පෙනේ. පැහැදිලිම උදාහරණය ඌවට දුන් හංස කොඩියයි. දිසාවලට කොඩි ප්‍රදානය කිරීමේදී "එය දුන්නේ පුද්ගලයෙකුටය" යන්න ගැන සැලකීමෙන් මේ අවුල නිරවුල් කරගත හැකිය. මේ කරුණ තවත් පැහැදිලි වන්නේ ආනන්ද කුමාරස්වාමි මහතාගේ "මධ්‍යකාලීන සිංහල කලා" යන ග්‍රන්ථයේ සඳහන් වන මහනුවර පෙරහැර ගමන් ගත් පිළිවෙල[66] පරීක්ෂා කිරීමෙනි. එහි උදාහරණ කීපයක් පහත දැක්වේ.

බුරහද මහ කොඩිය සහිත හතර කෝරළේ දිසාව

හංසයා කොඩිය සහිත ඌවේ දිසාව.

පටරෙදි (කාහපට) මහ කොඩිය සහිත සබරගමුවේ දිසාව.

මයුර මහ කොඩිය සහිත වලපනේ දිසාව.

තවද සමහර දිසා කොඩි දේවාලවල කොඩි හෝ දේවාලවල කොඩි දිසා කොඩි ලෙස හෝ භාවිත කළ බවද පෙනීයයි. මාතර දිසා කොඩිය දෙවුන්දර දේවාලයේ භාවිත කරන අතර සබරගමු දිසා කොඩිය සබරගමු සමන් දේවාලයේ උත්සව සඳහා යොදාගනු ලැබේ.

ඉහත සඳහන් කළ විස්තරය අනුව මුලදී දිසා කොඩි දිසාව ඇතුළුවම භාවිත කළද කල් යාමේදී එම කොඩිවලින් නොයෙක් අවස්ථාවලදී ප්‍රයෝජන ගෙන ඇති බව පෙනීයයි.

---

64. Sinhalese Banners and standards E. W. Perera. P. 3
65. " " " " " P 10
66. මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කේ. කුමාරස්වාමි - ප්‍රකාශනය - සංස්කෘතික දෙපාර්තමේන්තුව - පළමුවන මුද්‍රණය - 1962 - පිට. 38

## කාර්යාංශ හෙවත් දෙපාර්තමේන්තු කොඩි

පැරණි සිංහල රජ කාලයේ සිටම රජයේ කටයුතු කාර්යක්ෂම ලෙසත්, පහසුවෙන් කරනු සඳහා රාජ්‍ය අංශය විවිධ අංශවලට බෙදා තිබුන බව පෙනේ. ඒ අංශ අතරෙන් එකක් දෙපාර්ත මේන්තු. මේ දෙපාර්තමේන්තුවලට එක් එක් ලේකම් වරයා බැගින් පත්කර සිටියේය. පහත දැක්වෙනුයේ කොඩිංටන් මහතාගේ පොතක[67] දක්වා ඇති දෙපාර්ත මේන්තු හා ඒ දෙපාර්තමේන්තු වලට අයත් කොඩි විස්තරයයි.

මාලිගාවේ නිලධාරීහු

1. ගජනායක නිලමේ - හස්තියා මහ කොඩිය.
2. මහ ලේකම් මහත්මයා - අඳක්කද ලක්ෂ්මියා කොඩිය.
3. අතපත්තුවේ ලේකම් මහත්මයා - දුනුගඩ කොඩිය.
4. වෙඩිකාර ලේකම් මහත්මයා - රණපට කොඩිය.
5. කාලායක්කාර ලේකම් මහත්මයා - නිල්පට කොඩිය.
6. වඩන තුවක්කු " " - සුදුපට කොඩිය.
7. කොඩිතුවක්කු " " - කුඩා තුවක් තැවත් [illegible]. සඳහන් වූ කොඩිය.
8. පයින්ඩකාර " " - රතුපට කොඩිය.
9. බොන්ඩික්කුල " " - (ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් ඇතිකරන ලදී)
10. දුනුකාර " " - (කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඇතිකරන ලදී)
11. කුරුවේ " " - ගජනායක නිලමේ යටතේ සේවය කෙරිණ.
12. මඩුවේ " " ..........
13. කුරුවාන " " ..........

මේ හැර තවත් විවිධ කටයුතු භාර ප්‍රධානීන් ලෙස නිලමේ වරු පත්කර සිටියහ. මේ හැම කටයුත්තකටම වෙනම දෙපාර්තමේන්තු ඒවා බාරව නිලමේවරු සිටියද හැම දෙපාර්තමේන්තුවකටම කොඩි තිබුණ බවක් නොපෙනේ. මින් වැදගත් සේ සැලකෙන එවැනි පමණක් කොඩිදුන් අතර නුවර දළදා පෙරහැරේදී මම කොඩි ගෙනයනු ලැබීය.[68] ඊ. ඩබ්. පෙරේරා මහතා නායක කාර්යයට ප්‍රධාන දෙපාර්තමේන්තු තුනක් විය.

---

67. Notes on some of the Principal Kandyan chiefs and Headmen and their dresses - Appendix I. H.W Codrington - (Colombo Museum)
68. Sinhalese Banners and Standards - E.W. Perera P 27.

ඒ මෙසේය.

1. මහලේකම් - ලේකම් මිටිය හා පත්හිඳ
2. ගජනායක නිලමේ. - ඇතා කොඩිය.
3. කොඩිතුවක්කු නිලමේ - කුඩා තුවක්කුවක් සටහන් කළ කොඩිය.
4. මහලේකම් දෙපාර්තමේන්තුව - ඇතන්කඳ ලියන්නා කොඩිය.
5. හාභායක්කාර මුලේකම් - නිල්පට කොඩිය.
6. අතපත්තු ලේකම් - දිවුරගඩ කොඩිය.
7. වෙඩිකාර ලේකම් - රතුපට කොඩිය.
8. වඩන තුවක්කු ලේකම් - සුදුපට කොඩිය.
9. පයින්ඩකාර ලේකම් - රතුපට කොඩිය.

මාතර සමුපකාර රෝහලේ (පැරණි තුලංගකෝන් වලව්වේ) චිත්‍රයේ ඇඳ තිබෙන කොඩි අතරද ලේකම් කොඩි නවයක්. (දෙපාර්තමේන්තු)

1. වඩන තුවක්කු ලේකම් කොඩිය - කහ පැහැතිය.
2. පඩිකාර ලේකම් නිල්රතු කොඩිය - නිල් හා රතු පාට.
3. මහලේකම් ඇතන්කඳ ලියන්න කොඩිය - සුදුපාට ඇතන්කඳ ලියන්නා කොඩිය.
4. සත්කෝරළ ලේකම් දිසාවේ " - සුදුපාට සිංහ ලාංඡනය ඇත.
5. කොඩිතුවක්කු ලේකම් " - සුදුපාට තුවක්කුවක ලාංඡනය ඇත.
6. ගජනායක නිලමේ ඇතා කොඩිය - සුදුපාට ඇතා " ".
7. දිවුරගඩ ලේකම් කොඩිය - සුදුපාට දිවුලක " "

70 (අතපත්තු ලේකම් කොඩිය)

8. හාභායක්කාර ලේකම් කොඩිය - ලා කොළපාට
9. වෙඩිකාර ලේකම් කොඩිය - රතුපාට

කාබුරුපිටියේ වලේතොඩ විහාරස්ථානයේ පරම්පරාව දැක්වෙන පුස්කොළ ලිපියක ලේකම් කොඩි අටක් සඳහන්ව ඇත. (මෙම පුස්කොළ ලිපියේ විස්තර පෙර අවෝ ලිපියක දැක්වීම)

---

69. Sinhalese Banners and Standards E.W. Perera. P. 14

70. සැසඳීමෙන් පසුව මා යෙදූ නව නාමයයි.

1. වෙඩික්කාර ලේකම් රතු කොඩිය.
2. නානායක්කාර ලේකම් නිල් කොඩිය.
3. දිවුරණඩ ලේකම් කොඩිය (අතපත්තු කොඩිය)
4. ගජනායක නිලමේ ඇතුන් කොඩිය.
5. කොඩි තුවක්කු ලේකම් කොඩි තුවක්කුව.
6. මහ ලේකම් ඇත්කඳ ලිහිණි කොඩිය.
7. පඩික්කාර ලේකම් නිල්රතු කොඩිය.
8. වඩන තුවක්කු ලේකම් කහ කොඩිය.

ඉහත සඳහන් කළ මූලාශ්‍ර තුනෙන් අතපත්තු ලේකම් ගැන සඳහන් වන්නේ ඊ. ඩබ්. පෙරේරා මහතාගේ පොතේය. එය දෙවැන් තෙවැන් මූලාශ්‍රවල දිවුරණඩ ලේකම් කොඩිය යනුවෙන් හැඳින්වේ. අතපත්තු ලේකම්ගේ කොඩියේ සඳහන් ලාංඡනයද දිවුරණඩය බව අනෙක් මූලාශ්‍ර දෙක පරීක්ෂා කිරීමේදී පෙනේ. මේ අනුව දිවුරණඩ ලේකම් කොඩිය යනුවෙන් හා අතපත්තු ලේකම් කොඩිය යනුවෙන් හැඳින්වෙන්නේ කොඩි දෙකක් නොව එකක් බව පැහැදිලිය.

තවද පළමුවෙන් සඳහන් කළ මූලාශ්‍රයේ එක ලේකම් හා මහ ලේකම් දෙපාර්ත මේන්තුව යනුවෙන් දෙකක් සඳහන් වෙතත් අනික් මූලාශ්‍ර දෙකේ සඳහන් වන්නේ මහ ලේකම් ඇත්කඳ ලිහිණියා කොඩිය යනුවෙනි. බෙල් මහතාගේ කෑගල්ල වාර්තාවේ[71] සඳහන් හැටියට මහ ලේකම් කොඩියේ ලාංඡනය හැටියට තිබුනේ ලේකම් මිටිය හා පන්හිඳයි. එසේම 1757 දක්වාම මෙය පාවිච්චි කළ බව එහි වැඩි දුරටත් සඳහන් වෙතත් එවැනි කොඩියක ආකෘතියක් සොයාගත නොහැක. අනෙක් මූලාශ්‍ර දෙකේ සඳහන් වන මහ ලේකම් කොඩියේ ලාංඡනය වශයෙන් ඇඳ ඇත්තේද ඇත්කඳ ලිහිණියාය. මාතර සමුපකාර රෝහලේ ඇඳ ඇත, එහෙත් අනික් මූලාශ්‍රවල සඳහන් නොවන එක් ලේකම් කොඩියක් ඇත. එය ඌව කෝට්ට ලේකම් දිසාවේ කොඩියකි. මෙම කොඩියේ පැහැය සුදුය. සිංහ ලාංඡනයක් ඇත.

---

71 Report on the Kegalla District - Bell - p 126.

පෙර සඳහන් කළ මූලාශ්‍ර තුනේ ලේකම් කොඩි ගැන සඳහන් පිළිවෙල පරීක්‍ෂා කිරීමේදී එක් එක් දෙපාර්තමේන්තු එක්බදුම අනු පිළිවෙලක් අනුගමනය කර නැති බව පෙනෙන බැවින් එක දෙපාර්තමේන්තුවකට වඩා අනික වැදගත් කමෙන් වැඩි බවක් නොපෙනේ. ඒ ඒ දෙපාර්තමේන්තු සමානව තම සතු කටයුතු කළ බව සිතිය හැකිය. එහෙත් බෙල්[72] මහතාගේ දළදා පෙරහැරේ විස්තරය අනුව (ඊ. ඩබ්. පෙරේරා මහතාගේ කොඩි පොතේ සඳහන්ව ඇත.) මුල් තැන ලැබී ඇත්තේ ගජනායක කොඩියටය. එහි දැක්වෙන ඉතිරි දෙපාර්තමේන්තු පිළිවෙල මෙසේය.

2. කොඩිතුවක්කු ලේකම්.
3. නානායක්කාර ලේකම්.
4. මහ ලේකම්
5. අතපත්තු ලේකම් (දුනුකාර ලේකම්)
6. වඩික්කාර ලේකම්.

1821 දී ලියූ මෙම විස්තරයේ වඩන තුවක්කු ලේකම් හා පණ්ඩිකාර ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුවලට අයත් කොඩියේ එම දෙපාර්තමේන්තු ගැන සඳහන් නොවීමට හේතු විය යුතුය. සිංහල යුද්ධ හමුදාවේ මුලින් තිබූ දුනුවෙනුවට සිංහලයන් ද පසුව තුවක්කු පාවිච්චිය පටන් ගත්තේ පරංගීන්ගෙනි ඉගෙන ගෙනය. තුවක්කු වර්ග කීපයකි. මෙහිදී අපට අවශ්‍ය වන්නේ වඩන තුවක්කුවය. ගමන් වලදී ගෙන යාමට රජුට පිළිගැන්වූ තුවක්කුව වඩන තුවක්කුව නම්. රජතුමාට පලිහ පිළිගැන්වූ අය පලිහ වඩන වූ අතර, සැරයටි පිළිගැන්වූ අය සැරයටි වඩන නම ලැබූ බව සඳහන්ය. ඒ අනුව රජුට තුවක්කුව පිළිගැන්වූයේ වඩන තුවක්කු ලේකම්ය. දැනට (1821) සිංහල රජ කෙනෙකු නොමැති බැවින් මේ තනතුර අභාවයට යන්නට ඇත. ඒ නිසාම බෙල් මහතා මෙය සඳහන් නොකරන්නට ඇතැයි සිතිය හැකිය.

---

72. Sinhalese Banners and Standards - E.W. Perera . P 27

පරණ්ඩකාර ලේකම් ගැන සඳහන් නොවන්නේ මෙවැනිම කාරණාවක් නිසා විය යුතුය. කැඩපත් පරණ්ඩ, අටපට් පරණ්ඩ, ආදී නිදසුන් අනුව මහ වාසලට සහ උසස් නිලධාරීන්ට වුවමනා දේ සැපයීමට හා පණිවිඩ පතක් ගෙන යාමට සිටි අය පරණ්ඩ නාමයෙන් හඳුන්වනු ලැබීය. මේ අවධිය වන විට (1821) මෙවැනි සේවාවක් අවශ්‍ය නැත. එනිසා මෙකල එම තනතුර අහෝසි වී ගිය බව සිතිය හැකිය.

මෙවිට අතපත්තු ලේකම් කෙනෙකු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නගිනු ඇත. එසේ කියන්නේ මොවුන් වාසලේ සේවය කළ පිරිසක් නිසාය. මොවුන් රජුගේ ආරක්ෂක නිලධාරීන් ලෙසද සැලකිණ.[73] පසුකල අතපත්තු අසුපහාණ් වල කොටස් දෙකකට බෙදිණ. වාසල අතපත්තු හා දිසා අතපත්තු යනුවෙනි. මේ මොවුනු වලින්ද සමහරුදු තම සේවා කාලයෙන් අඩක් අධිකාරමයාගේ නිවාසයේත් අනික් අඩ දිසාවලත් සේවය කළහ. ලේව් මහතා සඳහන් කර ඇත්තේ එම පිරිස විය හැකිය.

මී ලඟට ඉහත සඳහන් කළ දෙපාර්තමේන්තුවල වැඩ ගැන කෙටි විස්තරයක් ඇතුලත් කිරීම අවශ්‍යවෝචිතයයි සිතමි. එහි මුලිකයා ලැබෙන්නේ මහ ලේකම්ය. මෙහි අනු පිළිවෙල යොදාගෙන ඇත්තේ මහනුවර පෙරහැරේ ගමන් කළ පිළිවෙලිනි. සෑම නිලධාරීන් අයත් ලේකම් වරු සමූහයක් සිටියහ. මහ ලේකම් සියලුම ලේකම් වරුනට ප්‍රධාන වන අතර එම තනතුර ක්‍රි: පූ: හතරවන සියවසේ සිට පැවත එන්නකි. රජය පිළිබඳව වාර්තාක් ලියකියවිලි වලට වගකිව යුත්තේ මොහුය. පෙර කල මහලේ මහලේනා යනුවෙන් හැඳින්වූයේ මොහුය. මහ ලේන තනතුර දැරූ චදුරින්ද නම් නායකයකු ගැන ධම්ප්‍රදීපිකාවේ සඳහන් වන අතර මහින්ද නම් මහ ලේඛකයකු ගැන මහා වංශයේ සඳහන් වේ.

---

73. JRAS (CB) Vol. XX P220, 301, 302, 316

ආණ්ඩුවේ ප්‍රධාන නිලධාරීන් පස්දෙනා අතුරෙන් පස්වැන්නා මහ ලේකම්ය. අදිපා, මාපා, සෙනෙවිරත්, භාණ්ඩාගාරික හා මහ ලේකම් පස්දෙන ප්‍රධානීන් හැටියට සැලකිණ. මහනුවර පෙරහැරේ මුල්ම තැන මහ ලේකම්ට දීමෙන්ම මොහුගේ තනතුරේ වැදගත් කම පැහැදිලි වෙයි.[74] මහ ලේකම් කොඩියේ ඇතුළත් සංකේතය ලේකම් තිවිය හා පත්හිද බව ඊ. ඩබ්. පෙරේරා මහතා ස්ව ග්‍රන්ථයේ සඳහන් කරයි.[75]

ඊළඟට වැදගත් දෙපාර්තමේන්තුව ගබඩායක නිළමේ දෙපාර්තමේන්තුවයි. මහනුවර සමයට පෙර මෙම දෙපාර්තමේන්තුවේ නායකයා ගබඩායක හෝ ගබනායක මුදලි හෝ නමින් හැඳින්විණ. ඕලන්ද සමයේදී මෙම තනතුර මාතර දිසාවකගේ අවෙකුල දී තිබුණ බව පෙනේ. ඒ කාන්දමානගේ දෙන් බලතිගයන් බව ගෝනියා කොඩ යටතේ සඳහන් කොට ඇත. ඒ බව සඳහන්ව ඇති පැද්යේ අන්දමට මෙම කොඩියේ සංකේතය හැටියට තිබුණේ ඇතු පැහැයක් බවද පෙනේ.

ඊ ළඟට කොඩි තුවක්කු දෙපාර්තමේන්තුව ගනිමු. රෝද පිට සවි කළ කුඩා කාලතුවක්කු කීපයක් කොඩිතුවක්කු නමින් හඳුන්වනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව ඇතිවිය යුත්තේ සිංහලයා පරංගීන් නිසා තුවක්කු භාවිතය පටන් ගැනීමට පසුව විය යුතුය. මෙම කොඩියේ සංකේතය සුදු පසු තලයක වූ කුඩා තුවක්කුවක ලාංඡනයකි. මෙම කොඩියේ අනුරුවක් මාතර සමූපකාර රෝහාලේ බිත්තියේ ඇඳ තිබේ.

---

74. මධ්‍ය කාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි - පිට. 38

75. Sinhalese Banners and standards - E. W. Perera. - P. 14

මහනුවර පෙරහැර විස්තරයේ මහ ලේකම් දෙපාර්තමේන්තුව යනුවෙන් වෙන් දෙපාර්තමේන්තුවක් සඳහන් වෙයි. ඒ හැර මුලින් සඳහන් කළ මහ ලේකම්ට අමතරවය. මෙම දෙපාර්තමේන්තුවේ කොඩියේ ලාංඡනය ඇත් කඳ ලාංඡනයයි. 76 මෙම කොඩියේ ඡායාපතක් මාතර සමුපකාර රෝහල් විත්තියේද ඇඳ ඇත. එහි තලය සුදු පාටය.

නානායක්කාර ලේකම් හා එම දෙපාර්තමේන්තුවේ කොඩිය ත්‍රිශූල කොඩියයි. නානායක්කාර වරු රදළවරුන්ගෙන් පැවත එන කොටසක් හැටියට හැඳින්විය හැක. මොවුන්ගේ රාජකාරිය නානායක්කාර වරුන්ගේ නම් ගම් ලියා පදිංචි කර තබා ලේකම් මිටිය භාරව සිට එකී නම් ගම් සටහන් කිරීමය. නානායක්කාර වරුනට ගබඩම් දී තිබූ නමුත් මොවුන්ගෙන් බලාපොරොත්තු වූයේ ශ්‍රමය නොවේ. රජයේ උසස් තනතුරු සඳහා තේරීමෙන් තෝරාගනු ලැබුවේ නානායක්කාර වරුන්ගෙනි. රජකුමාරගේ මෘත ශරීරය දිගේ රත්සළුවෙන දරසෑය දක්වා ගෙනයාමේ ගෞරවය මොවුනට හිමි වූ බව කියවේ. මේ නිසා මොවුන්ගේ රදළ බව නොකෙලෙසී පැවතුනා බවද කියවේ.

ඉංග්‍රීසි සමයේදී පහතරට ප්‍රදේශවල අලුතින් ඇතිකරන ලද නානායක්කාර වරුන් සපරමාදු යනුවෙන් හඳුන්වන ලදී. ඉපැරණිම නානායක්කාර නම ලැබුවෝ ඕලන්ද යුගයේදී සාන්කරම අසුහාමි වරු යනුවෙන් හැඳින්වූහ.

ඉහතින් සඳහන් කළ වාසල අසුහාමි වරු රජමාලිගාවේ සේවය කළ අතර අනෙක් අසුහාමි වරු දිසා මන්දිරයේ සේවය කළහ. දහඅටවැනි සියවසේදී මෙම කොටස් දෙකම එකතු කොට සපරමාදු අසුහාමි වරු යනුවෙන් හැඳින්වූහ. ඕලන්ද සමයේදී මෙම සපරමාදු අසුහාමි වරු තම සේවා කාලයේදී දෙආකාර සේවය කළහ. සේවා කාලයෙන් අඩක් ප්‍රභූත්ව භාවනේද අනික් අඩ දිසාපති භාවනේද ගත කළහ.

---

76. Travels in Ceylon - Dairy Plate viii

මේ අනුපත්ත වරු රජුගේ අංගරක්ෂක හටබලවරු වූහ. මේ දෙපාර්තමේන්තුවේ කොඩිය වූයේ දවුන්ඩ කොඩියයි. දවුන්ඩය රජතුමාගෙන් ලැබුනේ විශේෂ ගෞරවයකටය.

මෙය පළමුවන රාජසිංහ රජතුමා විසින් (1581 - 92) ගෞරවයක් වශයෙන් සොහොරන් මුදලිට දෙන ලද බව සඳහන්ය.[77] වීරසුන්දර බණ්ඩාරනුවර සිට සැඳවාගෙන ඒම මේ ප්‍රදානය කිරීමට හේතුව සේ පෙනේ. සොහොරන් මුදලිට පහර දීම සඳහා දොන් ජුවන් ධර්මපාල රජුගේ හමුදුවනට තම යුද කඳවුර මැදින් යන්ට විකුම සිංහ මුදලි රුඩ දුන්නේද දවුන්ඩ කොඩිය සොහොරන්මුදලිට දුන්නයයි.

තවද මෙම දවුන්ඩය ගැන සඳහනක් සිංහල රාජාවලියේ 79 වෙනි පිටේ බී. ගුණසේකර මුදලිගේ 118 වැනි සටහනේ ඇත. විශේෂ ගෞරවයක් සඳහා මෙය දුන් බවද සඳහන් වෙයි. දවුන්ඩය ගැන මත කීපයක්. එය ආභරණයක් යයි සමහරු පවසන අතර තවත් සමහරු කොඩියකැයි කියති. මේ බෙර විශේෂයකැයි ද හඳුන්වා ඇත. දෙවන රාජසිංහ රජු කොළඹ හරවන්නට ආවුත් රක්ෂා වන්නේ වෙසෙමින් දවුන්ඩය හා පංචලංසය පොල්ගසක එල්ලා තැබූ බැවි "දවුන්ඩය සහ පංච ලංසය එල්ලමින් පොල්ගැරෙන සම විට" යන පද්‍යයෙන් පෙනේ.

රජතුමාගේ ගමන් වලදී සේවකයනට යම් යම් නම නියමයන් කිරීමෙන් සාවද්‍ය කරන වේලාවල් හැඳින්වීමටත් වයනු ලැබූ විශේෂ බෙරයට දවුන්ඩයයි ව්‍යවහාර කළ බව සිතිය හැකිය. මෙවැනි රාජකීය ආභරණයක් යම් පුද්ගලයෙකුට හෝ දෙපාර්තමේන්තුවකට ප්‍රදානය කළේ විශේෂ ගෞරවයක් සඳහා බව පැහැදිලිය.

මෙම කොඩියක් ඊ. ඩබ්. පෙරේරා මහතා, බෙල්ස් රෝහලේ දුටු බව[78] කියයි. එම කොඩියේ මැද දවුන්ඩයක් සටහන් කොට තිබූ අතර එය වටා වැදගත් ලාංඡනයද වේ. තවද දුන්න, කඩුව, කඩුකොපුව, චක්‍රය, ඉසැවේරිය හා කොවේරිය දවුන්ඩය වටා යොදා ඇත. මෙයින් පෙනෙන්නේ යුධ සංකේතයක් භාවිත බවය. මාතර සමුපකාර රෝහලේ විත්තියේ මෙයද ඇත.

---

77. රාජාවලිය - බී. ගුණසේකර සංස්කරණය - පිට 65.

78. Sinhalese Banners and Standards E. W. Perera - P. 16.

මෙම කොඩියෙන් දැක්වෙන සලකුණු අනුව අකාවන්ත දෙපාර්තමේන්තුවට යුද්ධ පිළිබඳ කටයුතු කළ දෙපාර්තමේන්තුවක් ලෙස හඳුන්වා දිය හැකිය. එසේම මොවුන් රජතුමාගේ අංගරක්ෂක නිලධාරීන් වශයෙන් හඳුන්වා දිය හැකි නිසාත් යුද්ධ කටයුතු වලදී කළ දක්ෂකම් වලට දමුන්ඩය ප්‍රදානය කළ නිසාත් මෙම දෙපාර්තමේන්තුව ඉහත සඳහන් කටයුතු වල නියැලුණ බව පිළිගත හැකිය.

වෙඩිකාර ලේකම් හා පයින්ඩකාර ලේකම් දෙපාර්තමේන්තු වලටදී ඇත්තේ රතු පාට කොඩියයි. කාඩපත් පයින්ඩෙ, චී පයින්ඩෙ, මුතු සම්බා පයින්ඩෙ යනාදී නදනුන් අනුව සලකන විට මහා වාසලට සහ උසස් නිලධාරීන්ට ඉවමනාදී සැපයීමක්, එමෙන් පර්ණිඩ පතන් ගෙනයාමක් ප්‍රධාන වශයෙන් පයින්ඩ නාමයෙන් හඳුන්වන ලදී. මහා වාසලට අමු ආහාර සැපයීම ආදියෙන් ආදියක් පයිනඩ රාජකාරියට අයත්ය. ගමේ හොඳ පළතුරු ආදිය ද්‍රව්‍යවට ඒවාගේ නූලක් බැඳ ඒවා රජ වෙනුවෙන් වෙන්කොට තැබීමට සුදුසු කල ඒවා කඩා ගෙදරට සපයාව මහා වාසලට ගෙනයාම මහනුවර කාලයේ විසූ ඔළුවලු පයින්ඩ්වේගේ කාර්යයක්. පර්ණිඩ ගෙනයාම රජුට පමණක් නොව යුව භාමුදුව සඳහාද කළ බව පෙනේ.

වෙඩිකාර හාමුදුවට පෙරටුව ඔත්තු සැපයීම් වස් ගිනිපුන් යැවූ බව සිංහල සේනා සංවිධානය පරීක්ෂා කිරීමේදී පෙනී යයි. වෙඩිකාර හාමුදුවට දුන් රතු පාට කොඩියම පයිනඩකාරයාට දුන්නේද ඔත්තු සැපයීම එම හාමුදු රාජකාරියට අයත් කාර්යයක් හෙයිනැයි සිතිය හැකිය. රජවාසලට බඩුබාහිරාදිය සැපයීම පිළිබඳව ඔත්තුව ලැබෙනුයේ පයිනඩකාරයන්ගෙන්.

වඩන තුවක්කු ලේකම් කොඩිය සුදු පාට කොඩියයි. ගමන් වලදී ගෙන යනු සඳහා රජුට පිළිගන්වනු ලබන තුවක්කුව වඩන තුවක්කුව නමින් හැඳින්වෙයි. රජුට පළිහ පිළිගන්වන්නෝ පළිහ වඩන රාළලා යනුවෙන් හඳුන්වනු ලැබේ. තුවක්කුව පිළිගැන්වූ අය වඩන තුවක්කු ලේකම් හැටියට හැඳින්වූ බව සිතිය හැකිය.

## ආගමික කොඩි

රාජකීය මෙන්ම ආගමික පෙරහැරවල කොඩි ගෙන යෑමේ සිරිත ඉතා පුරාණයේ සිටම පැවතෙන්නකි. මුල්කාලවලදී මෙම සිරිත වැඩි වශයෙන් පැවතුණේ දළදා හා පාත්‍රා ධාතුව සම්බන්ධ උත්සව වලදීය. මේ අතර දේවාල මංගල්‍යයන්හිදී පැවැත්වූ පෙරහැරවලද, එම දෙවි දේවතාවුනට කැපවූ කොඩි ගෙන යන ලදී. පැරණියේදී මෙම උත්සව වලින් බලාපොරොත්තු වූයේ මෙම වස්තුවලට ගරුකිරීම පමණක් නොව කුමාර වරුනට දිසාවලට හා දෙපාර්ශ මෝස්තුවලට අයත් කොඩිද ගෙන යන ලදී.

මේ උත්සව සම්බන්ධව දළ විස්තර මහා වංශයේ හා අනෙක් සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වෙතත් සවිස්තර වශයෙන් මෙවැනි කොයකීයක් කිරීම ගැන සඳහන් වන්නේ බුද්ධාගම පුනරුත්ථානය කොට වාර්ෂික පෙරහැර සංවිධානය කර 1747 සිට 1778 දක්වා මහනුවර රජකම් කල කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ගැන මහාවංශය සඳහන් කරන විටය.[79] මෙතුමා විදෙස් ලංකිකයන් මහනුවරට කැඳවා, ඒ ඒ දෙපාර්ශමෝස්තු හා දිශා අනුව කොඩිදුන් බවත්, පෙරහැරේ කොඩි ගෙනයායුතු අන්දම ගැනත් උපදෙස් දුන් බවත් සඳහන්ය.

1752 පමණ කාලයේදී ලියූ දළදා පෙරහැර අලංකාරයේ දළදා පෙරහැරේ ස්වරූපය විස්තර කර ඇත. මෙම කොටසේ සඳහන් කරන්නේ ආගමික වැදගත් කමක් දරන කොඩි පමණය. කීර්තිශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලය දක්වා (1747 -1780) පෙරහැර පවත්වනු ලැබුවේ නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දෙවි වරුන්ට ගෞරව කරනු සඳහාය. මුල්වරට දළදා වහන්සේ (දෙවි වරුන්ගේ ලාංඡන සමඟ) මහනුවර පෙරහැරේ ගෙනගියේ 1775 දීය.

ඉහත සඳහන් විස්තරය අනුව මෙම පෙරහැරට ආගමික සංවිධාන පහක් සහභාගී වේ. 1775 පසු මින් වැදගත්ම වූයේ දළදා මාලිගාවය. මෙම කොඩියේ මැද නෙළුම් මලකි.

---

79. Mahawansa - chap 99 v 42-46

සතරවටේ පලාපෙති මෝස්තර සැරසිල්ලෙකි. හොරම්මලේ දෙපැත්තේ හොඬැල් පටලාගත් ඇත්රුවල දෙක බැගින් ඇත. මෙම කොඩිය විදුසන්දය පිරිවෙනේ බණ ගෙලාවේ සිල්මේ ඇඳ තිබේ. දළදා මාලිගාවට අයත් වෙනත් කොඩි කීපයකි. කතරගම, විෂ්ණු, නාථ, පත්තිනි දේවාලවලටද වෙන වෙනම කොඩි තිබිණ. පන්සල්වලට දී තිබුණ කොඩි එම පන්සල හා සම්බන්ධ උත්සව වලදී පාවිච්චි කරනු ලැබිය.

එකම ආයතනයට අයත් කොඩි කීපයක් ඇති බව කතරගම දේවාලයට අයත් කොඩි කීපයෙන් පෙනේ. පන්සල්වලට කොඩි කීපයක් දුන් බවට සාක්ෂි සොයාගත නොහැක. මෙය මෙසේ සිදුවීමට යම් කිසි හේතුවක් තිබිය යුතුය. මහනුවර සමයේ රජකල රජවරුන්ගෙන් වැඩි සංඛ්‍යාවක් නායක්කාර වරුන් වූ නිසා දෙවි දේවතාවුන් පිළිබඳ භක්තිය වැඩි වශයෙන් තිබූ බව පෙනේ. මේ නිසා එකී එකී රජවරුන් දේවාල සඳහා කොඩි ප්‍රදානය කල බව සිතිය හැකිය. නමුද බුද්ධාලයන්ට දුන් සමහර කොඩිද (සමහරවිට බෞද්ධයන් දියවඩන ගලමේලාව, කපුරාලලාව) දේවාලවල උත්සව වලදී පාවිච්චි කරන ලදී. නරේන්ද්‍රසිංහ රජතුමාගේ කාලයේදී එක් මුස්ලිම් නායකයෙකුට දුන් කොඩිය එම මුස්ලිම් පල්ලියේ උත්සව වලදී පාවිච්චි කරනු ලැබිය.[80] පන්සල්වලට දුන් කොඩි වැඩි පුරම දී ඇත්තේ නායක සාමිදුයන් වහන්සේටය. එහෙත් එම කොඩි එම පන්සලේ උත්සවවලදී පාවිච්චි කරනු ලැබිය.

කල්මන්නේ කාරිය කරවනාල කියූ පරිදි[81] රජවරුන් හා නායකවරුන් ඉදිරියේ ගෙනයන ලද්දේ වියත් 10ක් දිග වියත් 5ක් පළල විශාල කොඩියකි. වියත්යනු සාමාන්‍ය දිග අඟල් 32. ඒ අනුව කොඩියේ විශාලත්වය වටහා ගත හැකිය. මෙම එක කොඩියක් දැරීම හා ගෙනයාම සඳහා මිනිසුන් පස් දෙනෙකුගේ සේවය අවශ්‍ය විය.

---

80. Gazetteer of Ceylon - Casie chitty P 196.
81. Sinhalese Banners and standards - E.W. Perera P 25

- මහනුවර විෂ්ණු දේවාලයේ දැනට භාවිච්චි කරන ගුරුළු කොඩිය, මෙයට සැහැදිලි නිදසුනකි. මෙම මහ කොඩි ඉදිරි පසින් "මහබඹු" ගේ රූපයක් ගෙනයනු ලැබීය. අදද "මහබඹු" පෙරහැරවල ගෙනයනු ලබයි. මෙම රූපය පෙරහැරවල ගෙනයාමෙන් අදහස් කළේ දර්ශනීය මහ කොඩියට ඇස් වහ වැදීම වැළැක්වීමයි.

විවිධ දෙපාර්තමේන්තු වලට දුන් කොඩිවලින් එම දෙපාර්තමේන්තු වල ස්වරූපය පිළිබඳ හැඟීමක් දුන්නාසේම දේවාලවලට අයත් කොඩිවල සඳහන් වූයේ එක් එක් දෙවියාට ආවේණික යයි සැලකූ ලාංඡනය.

දෙවුන්දර දේවාලයේ කොඩිය ගුරුළු කොඩියයි. මෙය විෂ්ණු දෙවියන්ගේ වාහනයයි. පහළොස්වන සියවසේ ලියූ තිසර සන්දේශයේ හත්වන හා අටවන පැදිවලින් දෙවුන්දර දේවාලය හා කොඩිය ගැන විස්තරයක් කෙරේ. ඇම්බැක්කේ කතරගම දේවාලයේද ඇත්තේ ගුරුළු කොඩියකි. එහෙත් මෙම දේවාලවල තවත් කොඩි ඇත. මෙයින් තවත් කරුණක් හෙළිවේ.

දෙවුන්දර දේවාලයේ භාවිච්චි කරන කොඩි හතරකි. එන් ගුරුළු කොඩිය ප්‍රධාන වන්නේ විෂ්ණු දෙවියන්ගේ වාහනය නිසාය. මෙහි මකර දිගු කොඩියද ඇත. මෙම දේවාලයේ ඇති කොළඹ කොඩිය පුද්ගලික එකකි. එම කොඩියත් පෙරහැරේ ගෙනයනු ලබන අතර එය ගෙනයනු ලබන්නේ, එම කොඩිය ලද පවුලෙන් පැවත එන අය විසිනි. එහි ඇත්, තවත් එකකි. ගුරුළු කොඩිය. මෙය කොටුව වංශිකයන්ගේ කොඩියයි. අලුත්නුවර දේවාලයේද මෙම කොඩිය භාවිච්චි කරනු ලැබේ. මෙයින් ඒ දේවාල භාරව කටයුතු කරන මහ බෙන්මෝකි පුද්ගලික කොඩියක් දී ඇති බව පෙනේ. කාලයාමේ දී එම පුද්ගලික කොඩිත් දේවාල කොඩි ලෙස භාවිතයට ආ බව සිතිය හැක්කේ ඒ කොඩිවල සංකේතය ඒ ඒ දෙවිවරුන්ගේ සංකේත බව පිළිගැනෙන නිසාය.

මේ අතර තවත් කරුණක් සඳහන් කළ යුතුව ඇත. එනම් හිරු හා හඳ සංකේත රජකාම් දෙවිවරුන්ගේ සංකේත බවයි.[82]

---

82. The Religious Revolution of Lanka Dr. H.M.C de silva P 7
I Ed 1966.

මෙම සංකේත දෙක දේවාල කොඩි බොහොමයක සඳහන් ව ඇත. එහෙත් නන්කාර ගුරු හා හඳ සංකේත යෙදූ කොඩිය වංශ කොඩියක් හැටියට පිළිගැනීම වඩා යෝග්‍ය බව පෙනෙනුයේ එය වංශ ප්‍රභවයක් පැහැදිලි කරන නිසයි. පන්සල්වලට දී තිබෙන කොඩි බොහොමයක ඇත්තේ රාජකීය ලාංඡනයවූ සිංහයා ය. සමහරකට ගුරුළු මයුර ආදී පක්ෂීන්ගේ ලාංඡන ඇතුළත් කොඩි දී ඇත. නැත්ගෙන පරීක්ෂා කිරීමේදී පෙනීයන්නේ එම සවිනාවල වැදගත් දේවාලද ඇති බවයි.

පන්සල් කොඩිවල එකාකාර ස්වරූපයක් නැති බව පෙනේ. බුද්ධාගමෙන් ආභාසය ලද අපේ මූර්ති කලාව භාරතයේ ක්‍රම භාවිතා කළ බව සිතිය හැකිය. එහෙත් ලංකාවේ නිර්මාණ ශිල්පය භාරතයට වඩා හැඩගැස්මක් ලෙස සකස් වූ බව පෙනේ. බුදුහු අදිනාවයෙන් අසස්වයෙන් බුදුබව රාජ්‍යය කරවූහ. ධර්ම ප්‍රචාරය කාලේ ලේ හැලීමෙන් තොරවය. ඒ නිසා උන්වහන්සේ වැඩ සිටින විහාරය ගුද්දිරිට මුතුරක් හෝ කඩුවක් ගෙන් අත් ඇතිව සිටීම නුසුදුසු බව පැහැදිලිය. එබැවින් ඒ අවි ආයුධ වෙනුවට මල් කන්නක යෙදීම ප්‍රශංසනීයය. මෙවැනි ක්‍රම අපේ පැරණි විහාරස්ථානවල මූර්තිමත් වී තිබූ බව පෙනෙන අතර පන්සල් වලටදුන් රාජකීය කොඩියේ එන සිංහයාගේ අතට දුන්නේ කඩුවක් නොව මල් අත්තක් බව පන්සල් කොඩි පරීක්ෂා කිරීමේදී පෙනීයයි. මෙයට පැහැදිලි නිදසුනක් මාතර වටගෙදර පන්සලට කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් දී ඇති සිංහ කොඩිය.

ආගමික කොඩිගැන සඳහන් කරන විට තවත් වැදගත් කරුණක් අමතක කළ නොහැකිය. දේවාල හා පන්සල්වලට දුන් සමහර කොඩි ප්‍රදේශ කොඩි හැටියටද පාවිච්චි කරනු ලැබීය. මින් වඩාත් ප්‍රචලිතව ඇත්තේ කතරගම දේවාල කොඩියයි. එය රුහුණු දිසාවේද කොඩිය වේ. සබරගමුවේ සමන් දේවාලයේ පාවිච්චි කරන කොඩිය සබරගමු දිසාවේද කොඩිය වේ. මෙම පොදු පාවිච්චියට හේතුව වශයෙන් දක්විය හැක්කේ ඒ ප්‍රදේශවල පාවිච්චි කරන කොඩිය එම ප්‍රදේශයේ වැදගත්ම ආගමික මධ්‍යස්ථාන කොඩිය වන බවයි.

---

## ගෝත්‍රික කොඩි

රෝහණයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තවත් කොඩි විශේෂයක්, ගෝත්‍රික කොඩි. මෙනමින් මෙම කොඩි හඳුන්වා දිය යුතුව ඇත්තේ රජවරුන් එක් එක් කුලය අනුව විවිධ කොඩි දුන් හෙයින්.

ලංකාවේ කුල භේදය දක්ෂිණ භාරතයේ කුල භේදයට සමය. එහෙත් ඉන්දු භාරත කුලයට අසමානය. සිංහලයන්ගේ ප්‍රභවය ඇතුළුවූයේ බුද්ධාගමෙන්. එසේම එරටත් මෙරටත් අතර නොකඩවාම සාමකාමී මෙන්ම කලහකාරී සම්බන්ධකම්ද තිබිණ. බුද්ධාගමේ අන් සමාජක්‍රම මෙන්ම එම කුල භේදයද ලංකාව පැතිර ගියේය. එය ද්‍රවිඩ කුල ක්‍රමයට වඩා ආර්ය කුල ක්‍රමය අනුව සකස් වී ගිය බව පෙනේ. බමුණනට බෞද්ධ සමාජයක තැනක් නැති හෙයිනුත් රජකුලය එක දෙනෙකුට පමණක් සීමාවූ හෙයිනුත් වැදගත් කොටස හැටියට ගණන් ගත්තේ ගොවි කුලයයි ( ඡට බලන්න)

වෘත්ති කුලවල නාමවල ගැන විද්වතුන් විවිධ මත පලකරත්. පහළොස්වන සියවසේ රචිත සිංහල කාව්‍යයක් වූ ජනවංශයෙන් විවිධ කර්මාන්තවල නියුතු අය විවිධ කුලවලට අයත් බව කියනත් එකම වර්ගයකට අයත් බව පෙන්වීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ

"න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ" යනදී ගාථාව ගෙන හැර දක්වයි. සියලු අය එක් වර්ගයක් සේ සැලකීමට උත්සාහ දැරුවත් කුල අනුව සමාජය කොටස් වී බෙදී තිබුණ බවට සාධක, එක් එක් කුලවලට දුන් විවිධ කොඩි අනුව පැහැදිලි වේ. ජනවංශය අනුව පළමුවැන් හා දෙවැන් තැන් ගෙන ඇත්තේ ගොවි කුලය සහ සලාගම කුලයයි. ස දුරාව හා කරව කුල නවවැන් හා එකොළොස්වැන් තැන් ගෙන ඇත. කාසිචිට්ටි එස්ත් නම අකාරාදියෙහි (1834) ඇතුළත් ලේඛනයක කරාවනට දෙවන තැනක් රාමඤ්ඤන්ට (දුරාව) තුන්වැන් තැනක් දී තිබෙන බව "ආනන්ද කුමාරස්වාමි" [83] මහතා පවසයි.

---

ජනවංශය කුල විස්තරයක් සේ සමාජය වර්ග කොට තිබුණත් විදේශිකයන් පැමිණියාට පසුව මෙම වර්ග විස්තරයෙන් කොටස් රාශියක් අභාවයට ගිය බව පෙනේ. මහින්ද ගමනයත් සමඟ ලංකාවට අටළොස් ශ්‍රේණියක කලාකරුවන් පැමිණි බව මහා වංශයේ[84] සඳහන් වේ. මෙවැනි ලේඛන ගත සාක්ෂි නැතත් වුවද අද වන තුරුම විවිධ කොටස්වල ජනසමූහ ලංකාවට පැමිණි බවට කරුණු ඇත. "සිංහල සමාජය කුලවංශයන් කොටස්වලට බෙදී ගිය බවට පෞරාණික සාධක නොමැත. මුල් යුගයේදී කුල වංශයෝ කොටස්වලට බෙදී නොතිබුණ අතර ඒ ගැන යම් හැඟීමක් ඇතිවූයේ අටවන සියවස පමණ කාලසීමාවේදීය.[85]

කුල පිළිබඳ හැඟීම් සමහරවිට ඇතිවූයේ රැකියාව අනුව සමාජය ~~[illegible]~~ විවිධ සමූහ වංශයෙන් සංවිධානය වීමට පටන් ගත් පසුව විය යුතුය. සමාජ අවශ්‍යතා අනුව නිෂ්පාදන ද්‍රව්‍යවල ප්‍රමාණය වැඩිවන විට එක් එක් සමූහ වෘත්තීන් කරමින් වැඩිවිය. එක් ජන සමූහ නම "ස්ථාවරත්වය" ඒක ගැනීම සඳහා සමාජ චාරිත්‍ර චාරිත්‍ර නම කොටසට පමණක් සීමා කරගැනීම පුරුදු වූ නිසා ජන කොටසිංශය අතර නැවත පෙනෙන වෙනස්කම් මෙන්ම සංස්කෘතික අංගද ඇතිවිය. මෙම කොටස් අතරෙන් ගොවි, සලාගම, කරාව, නවන්දන්න, දුරාව යන කුල නම කායකීයන් අනුව වෘත්තීන් කුල නාමයට සංවිධානයවූ අතර ජන වංශය දක්වූ අනෙක් කුලකොටස් සේවකයන් ලෙස සලකනු ලැබිය.

කුල වංශයෙන් වෙන්වී තිබුණත් ඔවුන් අතර සමාජ එක්සත් කමකට තුඩුදුන් විවිධ බලවේග අතර බුද්ධාගමට මුල් තැන ලැබේ. ඉන්පසු ආගම් අතර පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසීන් විසින් මෙරටට ගෙනෙන ලද ආගම්ද සැලකිය හැකිය.

---

84. මහා වංශය 19 පරිච්ඡේදය - 29 ගාථාව

85. Society in mediaeval Ceylon Dr. M.B. Ariyapala p 284 - 85

ඉහත සඳහන් කළ බලවේග මෙන්ම එක් එක් කුලවතුන්ගේ කාර්යක්ෂම භාවයත් රාජපක්ෂික භාවයත්, ඒ ඒ කුලවලට එක් එක් අවස්ථාවලදී මුල්තැන ගෙන ක්‍රියාකරන්ට අවස්ථාව ලැබුණි. සමහර විට ආගමික මත භේද උඩ සමහර කුල වලට වඩ හිංසාද ලැබිණ. ලන්දේසි සමයේ කරාව කුලයේ අයට පරිහාර ලැබුණේ මේ නිසාය.

කුල ක්‍රම ගැන කථා කරන විට අපට නිතැතින්ම පෙනෙන ගැටලුවක් වෙයි. ගොවිකුලට විශේෂවූ කොඩියක් නැත්තේ ඇයිද? යන්නය ඒ. මේ පිළිබඳ මත දෙකකි. එයට හේතුව ඔවුන්ගේ සංවිධානයේ දුබලකම යයි එක් මතයකි. එහෙත් එය පිළිගත හැකි මතය එය නොවේ. ගොවිකුලය මෙරට බහුතර පක්ෂයයි. එමෙන්ම සංක්‍රමණය අනුව බැලුවත් මුලින්ම මෙහි පැමිණි අයයි. මෙසේ සඳහන් කළේ සලාගම, දුරාව, කරාව, ආදී කුලවතුන් පසුකාලවලදී මෙරටට පැමිණි බවට සාධක දක්විය හැකි බැවිනි. දෙවනු භුවනෙකබාහු රජ සලාගම නායකයා පිළිගත් අයුරු එම වංශයේ කොඩියේ දක්වෙන බව සාමාන්‍ය පිළිගැනීමයි. කරාව වංශිකයන්ගේ විශාල කොටසක් පැමිණියේ කෝට්ටේ සමයේදී යයි සිතිය හැකිය. කුරුවන්ගේ පැමිණීම විස්තර කරන "වන්නි උපත" පොතේ ඔවුන්ගේ ප්‍රධානීන් ගේ නාමයන් ද, ලංකාව වාස භූමි කර ගැනුමද, යුද්ධවලදී ලබාගත් ජයද රජතුමාගෙන් ලබාගත් දේද ගැන සඳහන් වේ.

ඔවුන්ගේ පැමිණීම බවත් සංවිධානය වී සිටි බවත් හෙළිකරවන්නක් නිශ්ශංකමල්ල රජුගේ උත්තරද්වාර සෙල්ලිපියෙහි සඳහන් සෙල්ලිපි පාඨය." ගොවිකුලයේ ඇත්තන් රජ ලීලාවට නොපැවතුව මැනව, කෙසේ බලවත් වුවද ගොවිකුලයේ ඇත්තෝ රාජ්‍යයට බලා නොගත යුත්තාහ. එසේම බහුතර පක්ෂයවූ මොවුනට එක්රැස් වූ අවස්ථාවලදී, අන් සුළු කොටස් වලින් වෙන් කොට හඳුනා ගැනීමට සංකේත වුවමනා නොවීය.

තවත් මතයක් අනුව ඔවුන් රාජ වංශයට අයත් හැටියට සැලකූ නිසා වෙනම සංකේතාත්මක හැඳින්වීමක් අවශ්‍ය නොවීය. මේ සම්බන්ධයෙන් විවිධ මත ඇතත් ඔවුන් (ගොවි වංශිකයෝ) උදෙසා වෙනම කොඩියක් පාවිච්චි කළ බවට සාධක නැති බව පමණක් පැහැදිලිය. බහුතර පක්ෂය අනුව මොවුනට වෙනම ලකුණක් අවශ්‍ය නොවීම අනුව අනෙක් "ස්වල ජනතාවට" (කුළ වලට) වෙනත් සංකේත දුන් බෝහොද නිවේය යුතුය.

මෙම විජය කුළ වලට අයත් පිරිස විජය අවස්ථාවලදී මෙරටට පැමිණි අයයි. මේ අය මෙහි පැමිණ විජය නායකයන්ට යෙදුන බවට සාධක ඇත." දුරාවේ ගෝත්‍ර නාමය හා කරාවේ ගෝත්‍ර නාමයද වූ යෙසිංහ, තොරව දෙදෙනාගෙන් ඇත්වූ යේයැය අනුමාන පෝෂක මතයකි. පාලි භාෂා ධුර ශබ්දය හා කෘත්‍ය වාචී "රාවෝ" ශබ්දයද, සමුද්‍රවාචී "කර" ශබ්දය හා කෘත්‍ය වාචී "රාවෝ" ශබ්දයද ගාත්‍රාන්තර ලෝප සන්ධි විධියෙන් සන්ධි වී "දුරාවෝ" "කරාවෝ" යන පද සිද්ධවී ඇත. ගොඩ යුද්ධයෙහි යෙදී සිටියවුන්ට "දුරාවෝ" කියාද, මුහුදු යුද්ධයෙහි යෙදී සිටියවුන්ට "කරාවෝ"ය කියාද ව්‍යවහාර කරගෙන ආ බව පැහැදිලිය![86] එසේම කරාවෝ යන නම (කරේ - මුහුදු - ආවෝ - පැමිණි) යන අරුතින් යෙදී ඇති බව එච්. එම්. සී. ද සිල්වා මහතා සිය ග්‍රන්ථයේ[87] සඳහන් කරයි.

දුරා ගෝත්‍රිකයන්ට සිංහ නම් ලද කුළුම් ප්‍රදේශයෙන් ආ නිසාම හෝ ගොඩ යුද්ධයෙහි යෙදී සිටියවුන් නිසාද, ගොඩ වසන සතුන් අතර ශූර වීර, ශ්‍රේෂ්ඨ සතෙක් වූ රක්තවණී සිංහලයෙකුගේ රූපයක් සටහන් කරන ලද කොඩියක් හා කරාවේ ගෝත්‍රිකයනට මුහුදු යුද්ධයෙහි යෙදී සිටිය නිසා මුහුදේ වසන සතුන්ගෙන් ශ්‍රේෂ්ඨ සතෙක් වූ මකර නම් මත්ස්‍යයකුගේ රූපයක් සටහන් කරන ලද කොඩියක් ද පුරාණ සිංහල ආරම්භ කාලවල සිට භාවිත කිරීමට බලය දී තිබුණ බව විචාර සටහන් ආශ්‍රයෙන් සිතා ගත හැකිය.

---

86. මානුරජනය - ජී. ජී. සිලානන්ද සාවර - I මුද්‍රණය - පිට - 46
87. The Religious Revolution of Lanka - Dr H.M.C. de Silva I Ed 1966 P I

ගොඩ යුද්ධ හමුදාවට ඇතුළත් දුරාව කුලිකයනට "දස වර්ණකයෝය, දස කුලිකයෝය, දස ධුරාවෝ" යැයි ව්‍යවහාර කරති. මොහු යුද්ධවලදී දස සංඛ්‍යාවට බෙදී රජයට දක්වන ලද බව[88] මානුරත්නයේ දැක්වේ. මෙම කොටස් දහයෙන් කොටස් දෙකක් වූ නවමන් දුරා හා මගුල් දුරා කොටස් දෙකට පුරාතන සිංහල ආණ්ඩු කාලවල පටන් රතුවන් සිංහයෙක් සලකුණු කරන ලද සුදු කොඩියක් භාවිතා කරගෙන ආ බව ෆිලන්ද නාමයෙන් ලංකාව සම්බන්ධයෙන් ග්‍රන්ථයක් ලියන ලද ජුන්ස්ස් වැලන්ටයින් මහතා සඳහන් කර ඇත.[89]

"ලංකාවේ බොහෝ වෙල් වල තබන ලද ශිලා ලේඛන වල යුද්ධ මුලාදෑන්-ගේ ඒ ඒ ධජාකාර වලට අයත් ඇඳුම් පැළඳුම් වල වර්ණයද බොහෝ දුරට අන්තර්ගත කර තිබේ......... සිංහලයන් අතරද පෞරාණිකයෙන් කොඩි භාවිත කිරීමේ සිරිතක් තිබුණා යැයි කීම සුදුසු නැත. නමුත් යුරෝපයේ මෙන් භාවිත කළ අදහසට වඩාව සිංහලයන් විසින් ඒ කොඩි භාවිත නොකළා වෙන්නට පිළිවෙල...... එක් එක් ජාතියේ අය තම තමන් විසින් ගෙන යායුතු නොයෙක් සටහන් වලින් යුත් කොඩිවලින් ඒ ඒ ජාතිවල විශේෂතාවය පැළඳූහ. කරාවේ අයවලුන් විසින් මකරාන් මත්ස්‍යයෙකුගේ සටහනක් ඇති සුදු කොඩියක්ද, මගුල් දුරා නවමන් දුරා යන අයවලුන් විසින් රත්තවණී වූ සිංහයකුගේ සටහන් ඇති අඩයාලම් සුදු කොඩියක්ද නවන්දන්නා අයවලුන් විසින් වලිකුගේ සටහනක් ඇති කොඩියක්ද භාවිතා කරන ලදී.[90]

---

88 මානුරත්නය - ශ්‍රී. ශ්‍රී. සිලනාද සංස්කරණ - පිට - 49

89. Philalethes - Ceylon p 327 - 28

90 Monumental - remains of the Dutch East India Company in Ceylon JRASCB 1898 VOL XV P 213-14

ඉහත භාගයේ සඳහන් කළ සිංහයෙක් සටහන් කරන ලද කොඩිය මුදලි ද්‍රවිඩයාට හා තවමත් ද්‍රවිඩයාට පමණක් නොව ද්‍රවිඩයේ ගෝත්‍රයේ දස වර්ණක ද්‍රවිඩයාටම අයත් බව "වංශ කතා" සාක්ෂයන් පැහැදිලි වේ. එසේම මෙකී ලාංඡන දරන කොඩිය පමණක් නොව ඉර හඳ කොඩියක්ද ද්‍රවිඩ ඇල්ලකයන් විසින් භාවිතා කරනු ලැබූ බව පෙනේ. එසේම කරාවේ ගෝත්‍රයේ අයද මකර, මත්ස්‍ය, ඉර හඳ කොඩි පාවිච්චි කරගෙන ආ බව හා දැනුදු භාවිතා කරන බවද පෙනේ.

බු: ව: 2304 දී (දෙදහස් තුන්සිය හතරේදී) ජාත්‍යස්කාබ දර ඕලන්ද රජුගේ හමුදා සේනාවේ ගජනායක නිලය දැරූ කන්දලාහගේ ජෙනි බස්තියන් සිරි නමැත්තාගේ ආදාහනය වේලේදී ගජමන් නෝනා කී කවියක් මෙසේය.

"වරණ එක්සැරූ මුදලි ගජනා කොඩිය බැඳ පෙර ලක්සයේ.
එගෙන බාසුරු දන්දු සඳරූ තබා කොඩි යුග අත්සයේ.
නරන දුන් ගර මාල රන් කග තබා දෙන මතු අත්සයේ.
දරණ කලුවන් මහාවි හම් වග දෙපෙල පැදී සිතු සත්සයේ.[91]

මෙතුමංගේ මුදලි කමට ලැබුණු ගජනායක කොඩිය පෙරටු කොට සිංහලයට නම ගෝත්‍රයට අයත් සඳ හිරු කොඩිය හා මැද සිංහ රූපයක් සටහන් කරන ලද කොඩියක්ද එගෙන ගිය බව දක්වයි.

"ඉර හඳ කොඩිය, මකර කොඩිය, රාවණා කොඩිය ආදී රාජකීය සළකුණු පාවිච්චි කිරීමට ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාගෙන් ලබාගත් අවසරයද, හැට පන්සල ලබාගත් සන්දගම් ආදියද, බදු සුන්ගම් ආදිය නැතිව දහ අට කොරලයේ වෙලෙඳාම් කිරීමට අයත් සන්දගම්ද ආදී කරුණු සමූහයක් "වන්නි උපතේ" දැක්වේ. මෙය සඳහන් වන්නේ කරාවේ වංශිකයන් වෙනුවෙනි.

---

91. මනුරත්නය - ජී. ඵලාහාන්ද සර්වර - I මුද්‍රණය 1929 පිට - 107

සලාගම වංශකථාන්හිද ලංකාද්වීපට පැමිණියේ දෙවන භුවනෙකබාහු රජතුමාගේ කාලයේ බව සාමාන්‍යයෙන් පිළිගැනේ. එම අවස්ථාවේ දී මුල කොඩියේ නේතෘනායකයාට, රජතුමා කළ විවිධ සත්කාර සම්බන්ධ සිද්ධි කීපයක් නිරූපණය කර ඇත. රාජපක්‍ෂ වලව්වේ තිබී හමුවූ මෙම කදයේ කොඩියට "හරදීර" කොඩිය යැයි (නායකයාගේ නාමය අනුව) හඳුන්වා දී ඇත. මොවුහු මුලින් රෙදි වියන්නෝ වූහ. සාලි ග්‍රාමයෙන් පැමිණි බවද සඳහන්ය. සාලා-ග්‍රාම - සලිග්‍රාම සලාගම වූ බව පිළිගත් මතයකි.

පසුකාලයේදී (විශේෂයෙන්ම ඕලන්ද කාලයේදී) මෙම කොඩියේ ස්වරූපය වෙනස් වූ බව පෙනේ. මොවුන් පෘතුගීසි, ලන්දේසි යුග දෙකේදී ප්‍රධාන රැකියා දෙකක යෙදුන බව පෙනේ. මේ අනුව එය නැවත කුරුඳුකාර හා හේවා පන්න යනුවෙන් කොටස් දෙකකට බෙදුණි. එක් කොටසක් කුරුඳු තැලූ අතර අනිත් කොටස යුද්ධ හමුදාවේ කටයුතු කළහ. දැනුදු මෙම කොටස් දෙක අතර උසස් පහත් භේදය පවතී. ඔවුන්ගේ කොඩියටද කුරුඳු වේලයක් හා එහි සිව් මත්ස රූපයට පසුව කුරුඳු අත්තක්ද එකතු වූ බව පෙනේ.

දුරාවේ අඬගාලම් කොඩිය තවම සොයා ගත නොහැකි වුවත් නවන්දන්න කුලයේ කොඩියක් සොයාගෙන ඇත. මධ්‍යයේ විශ්වකර්මයා දක්වා ඇත. ඔහුගේ වම් අතේ රාජ යෂ්ටියක්. දකුණු අතේ කලා ශිල්ප පිළිබඳ ග්‍රන්ථයක්. රාජකීය ඇඳුම් ඇඳ නානුමුදු එහි ඇති අතර කොඩියේ පහත දකුණු කෙළවරේ ඔරුනාම ක්‍රියාත්මක කරන්න එන්හෙක්. කම්මකාරයා කිණිහිරය උඩ යකඩයක් අඬුවකින් අල්ලා කලයි.

තවත් කොඩියක ප්‍රධාන තැන ලැබී ඇත්තේ හනුමානය. විශ්වකර්ම හිමාලය මුදුනේ වාඩිවී සිටී. හනුමාගේ හා ලඟ මිටිය, සක්පත්‍රය, අඬුව, මත්තහම හා උදුන වෙයි. මාතර නගරයේ සිට සැතපුම් හතරක් පමණ කැකණදුර පාරේ ගිය විට හමුවන මොටගෙදර කපු ඇපට හමුවූ නවන්දන්න කොඩිය මෙතෙක් සොයාගෙන ඇති නවන්දන්න කොඩිවලට වඩා වෙනස් වේ. මෙහි මැද හනුමන්තා රූපයකි. හතර කොනේ වක හතරකි. එම වක හතරේ කළවැස්සා හතරක් නිරූපනය. මෙම වක්‍ර හතරින් එකක් මහ පට්ටලයක් නිරූපනය කෙරේ. මෙම කුළයේ පට්ටල් වර්ග හතරකි. ඉන් ඉහළම එක ඔටුනු පට්ටලයයි. තවත් ආභරණ, රන් කලස්, හා අමන කවි යානුවෝ පට්ටල් තුනයි.

"~~නවන්දන්න කුලයේ~~ නවන්දන්න කුලයේ ආරම්භය පුත්‍රයන් පස්දෙනා කෙරෙහි ආරෝපනය කරති." මෙයින් සියල්ලටම වැඩිමහල් මනු යකාව වැඩද, දෙවැනි මායා දුව වැඩද, තෙවැනි ත්වස්තෘ පිත්තල, තඹ ලෝහ වැඩද, හතරවැනි ශිල්පී ගල්වැඩද, පස්වැනි විශ්වඥ රන් රිදී හා ආභරණ වැඩද කළේය.[93]

ඉහත දැක්වූයේ විවිධ කුලවලට අයත් කොඩිවල සඳහන් වන සලකුණු කීපයකි. එම සලකුණු අනුව ඒ ඒ කුලවල මිනිසුන් යෙදී සිටි ප්‍රධාන රැකියාවේ ස්වභාවය අනුව එම කොඩිවල සංකේත ඇතුළත් වී තිබෙන බව පෙනී යයි.

මේ කොඩි ඒ ඒ කුලවල උත්සව වලදී පාවිච්චි කළ අතර, විවිධ බලපෑම් උඩ එම කොඩිවල ස්වරූපය වෙනස්වූ බවද සිතිය හැකිය. කරාවේ කොඩියට කුරුසයක් ද ඇතුළත්වූයේ කතෝලික ආගමේ බලපෑම නිසාය. තවත් සමහර තෝත්තුක කොඩි දේවාල කොඩි හැටියටද භාවිතා කරනු ලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර ආගමික කොඩි යන කොටසේ සඳහන් වනු ඇත.

---

92. ඩී. දේවේන්ද්‍ර මහතා, මොටගෙදර - මාතර

93. මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි - 1 මුද්‍රණය - පි. 63.